# නිවන් දකින්නට කාලයයි

(පළමු වෙළුම)

## සතිය කියන්නෙ අපේ ගෙදර



''තුම්හෙහි කිච්චං ආතප්පං-අක්ඛාතාරෝ තථාගතා''

## බුද්ධෝත්පාද දේශනා මාලාව

# සම්මාදිට්ඨිය

**බුද්ධෝත්පාද ධර්ම දේශනා ශ්‍රවණයට**

https://youtube.com/channel/UCWMS4oom8EsZc9foKt_Eajg

**ධර්ම ග්‍රන්ථ පිළිබඳ විමසීම්**


E-mail : maneljayathilaka37@gmail.com

Tel : 077 0627553

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

## 01
# සතිය කියන්නේ අපේ ගෙදර.

අපි පොඩ්ඩක් කථා කරමු ප්‍රායෝගික පැත්ත ගැන, ඔබට ධර්මය ගැන ගොඩක් දේශනා අසන්න ලැබෙනවා. ඒවා ඔබ හොඳින් අධ්‍යයනය කරන්න. නිවැරදි නිවන්මඟ දිසානතිය ඔබ විසින්ම හඳුනාගත යුතු වෙනව. මේ දර්ශනය බුදුන්වහන්සේ ලෝකයට දේශනා කරන දර්ශනය, ඒ දර්ශනය දැනගත යුතුමයි. බුද්ධ දර්ශනයෙන් තොරව නිවන් මගකුත් නෑ. ඉතිං ඒ දර්ශනය දන්නව ඇති කියල අපි හිතනව. ඇත්තටම මේ මාර්ගයේ දර්ශනය අවබෝධ කරගෙන, ඒ දර්ශනය ප්‍රත්‍යක්ෂතාවයට පත්වීමටයි පුහුණු වෙන්නෙ. හැම කෙනෙකුගේම පූර්වභාග ප්‍රතිපදාව කියන්නේ දර්ශනය අවබෝධ කර ගැනිම, ඒ දර්ශනය ගැන බණ අහල, කල්‍යාණ මිත්‍රයන් හමුවෙල, ධර්මය ශ්‍රවණය කරල මේ ලෝකයේ ඇත්ත මොකද්ද කියන එක හොයා ගන්න ඕන. ඉතින් ඒ දැනුම මුලින් තමන් දැනගන්න ඕන. බුදු කෙනෙක් ලෝකයට පහල වෙලා, ඒ ලෝකයේ සත්‍ය හෙලිකලේ නැතිනම් කවුරුවත් දන්නේ නෑ, අපි කථාකරන තේරෙන භාෂාවෙන් මේ ගැන පැහැදිලි කරනවනම්, අන්න ඒ ලෝකයේ ඇත්ත දැනගන්න ඕන. ඔබ ඒ ලෝකයේ ඇත්ත දැනගන්නව. අපි හිතනව ඔබ දැන් ලෝකයේ ඇත්ත දන්නව කියල. අපි ඔබ දැන් ඒ දර්ශනය දන්නව කියල, සමහර විට මේ අහන හැමෝටම තේරෙන්නේ නැතිව ඇති. මේ අහන හැමෝටම මේ දර්ශනය අවබෝධ වෙලා නැතිව ඇති. නමුත් ඔබ අතරේ

ඉන්නව නේද බුදුරජාණන් වහන්සේ ලෝකයට දේශනා කරපු ඒ ධර්මය කුමක්ද? ඒ බුද්ධ දර්ශනය කුමක්ද? ඒ පරමසත්‍ය කුමක්ද? කියල දන්න අය ඉන්නව ඔබ අතරේ. අපි හිතනව අන්න ඒ අයට මේ දේශනය වැදගත් කියල. අපි මෙය දේශනයනකට වැඩිය, අපි ඉදිරිපත් කරන්නේ ප්‍රායෝගික අත්දැකීම්. ඉතිං මේ අත්දැකීම් ඔබට වැදගත් වෙනව. ඔබ දැන් දන්නව, අපි කථා කරන්නෙ නෑ අද පරියාය ගැන. අපි කථා කරන්නෙ ප්‍රායෝගික පැත්ත පුහුණු වෙන හැටි. ඔබ දන්න කෙනෙක් කියල හිතලයි අපි මේ කථා කරන්නේ. ඒ පිළිබඳ දේශනා අපි දිගටම ඉදිරිපත් කරනව. ඒ දර්ශනය පිරිසිදු කරගන්න ඕන කරන දේශනා, අපි ඉදිරිපත් කරනව.

එවා බුදුරජානන් වහන්සේ දේශනා කල සූත්‍ර වලින්ම පැහැදිලි කර දෙන්න උත්සාහ කරනව. ඒව ඔබ අහනකොට, අහනකොට, ඔබට යම්කිසි පැහැදිලිතාවයක් ඇතිවෙයි. දැන් අපි ප්‍රායෝගික පැත්තට එමු, අපි අද කථාකරනව අපි වගේම අයත් සමග ඒ කියන්නේ මේ මාර්ගය තුල ප්‍රතිපදාවක පිහිටල පුරුදු වෙන අය සමග. සමහර විට ඔබ ගිහියෙක් වෙන්න පුළුවන්, සමහර විට භික්ෂූන් වහන්සේ නමක් වෙන්න පුළුවන්, එය අදාල නෑ ගිහියෙක් ද, පැවිද්දෙක් ද, ගැහැණු ද, පිරිමි ද, වයසක කෙනෙක් ද, වයසින් අඩු කෙනෙක් ද, ඒ කිසිවක් අදාල නෑ. ඔබගේ රූපය ද ඒ කිසිවක් අදාල නෑ. මෙතන එකම එක දෙයයි වැදගත් වෙන්නේ. ඔබට හිතක් තියෙනව,එහෙමනම් සැප දුකකුත් තියනව, එහෙනම් ඔබට නිවනකුත් තියෙනව. එහෙනම් ඔබට දුකින් මිදෙන මගක් තියෙනව. එච්චරයි වැදගත් මේ. අහන කෙනා කවුද තරාතිරම මොකක්ද, මොනවත් අදාල නෑ. රජ කෙනෙක් බණ ඇසූවත්, අන්ත දුගියෙක් බණ ඇසුවත්, දෙදෙනාම

මනුෂ්‍යයෝ. දෙදෙනොම මියයනවා. දෙදෙනාටම මරණිය තියෙනව. හැබැයි හැම කෙනෙක්ම එකම ස්වභාවයක තමයි ධර්මය තුළ අපට පෙනේන්නේ අසරණයි. මිත්‍යා දෘෂ්ඨිය කියන්නේ නොදන්නාකම, අවිද්‍යාව, ඒ තුළ ඉන්න තාක් අසරණයි. දැන් ඔබ දන්නව බාහිර ඇත්තක් නොවන බව. ඔබ දන්නව අපි සිතින් හදාගත්ත සිතිවිලිත් එක්ක තමයි අපි ජීවත් වෙන්නේ. එනම්, සතර මහ භූත අපට පේන්නේ නෑ. බාහිරය අපි දන්නේ නැ, අපි හිතාගෙන ඉන්නවා සිතුවිලි තමයි බාහිර තියෙන්නේ කියල, නා ගස, නුග ගස, දෙල් ගස, අඹ ගස, මේ කියන්නේ අපියි. මේ නම් දාන්නේ අපියි ඉංග්‍රීසියෙන් එක එක නම් කියනව, දෙමළෙන් තවත් නම් කියනවා, චීන භාෂාවෙන් තවත් නම් කියනවා, සිංහල භාෂාවෙන්  තවත් නම් කියනව, ඔබ මේ කථාකරන හැම භාෂාවක්ම සංඥාවක්. ශබ්දයක් විතරයි. ඒ ශබ්දයට ගැට ගැසුණු රූපයකුත් තියෙනව. අන්න ඒ ගැට ගැසීම නිසයි සිතක් කියන්නේ. දැන ගැනීමක් වෙන්නෙ, විඤ්ඤාණය කියන්නේ ශබ්දය ඒ රූපයේ ගැට ගැනීම නිසා ඔබට කථාවක් තියෙනව. ඒ දැන ගැනීමත් විඤ්ඤාණයක් තියෙනව. විඤ්ඤාණයම තමා සිත කියල කියන්නෙ. එතකොට ඔබට මේ ශබ්දය ශබ්දයක් විතරක් වුනා නම්, වර්ණය වර්ණයක් විතරක් වුනා නම්, එහෙම දෙයක් වෙන්නේ නෑ. ගැටලුවකුත් නෑ. ඒ වගේ ම තමා දිට්ඨ, සුත, මුත කියන. දැනීම, ගන්ධය, රසය, පහස, උණුසුම සීතල, කියන්නෙ ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ මෙන්න මේවා දැනීමක් විතරයි. දැන් මේ ධර්මය දන්න කෙනාටයි අපි මේ කථා කරන්නේ. මේවා අපි පැහැදිලි කරන්න උත්සාහ කරන්නේ නෑ. මේවා අපි දිගින් දිගටම පැහැදිලි කලා. දැන් අපිට



www.buddothpado.com

තියෙනව පුහුණුවක්. අපට දැනුමක් තියෙනවා මේ ලෝකය ඇත්තක් නෙමේ කියල. අපි හිතින් හදාගත්තු සිතිවිලි ලෝකයක ජීවත් වෙන්නෙ කියල , ඒක පැහැදිලියි. ඒක තමයි දැනුම, එතකොට මේක අපට ප්‍රත්‍යක්‍ෂ වෙලාද? ඔබට දැන් මේ මොහොතෙ අරමුණු එනව. සිත කියලා කියන්නේ අරමුණු ගැනීමමයි. ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසාම සිතිවිලි එනව. අරමුණු නැති මොහොතක් නෑ. මේක මැෂින් එකක් වගේ. එක තමයි අනිත්‍ය ස්වභාවය තුල ගලනව සුළඟ නවත්වන්න පුළුවන්ද? සුළගට ආරම්භයක් පණවන්න පුළුවන්ද? සුළගට අවසානයක් පනවන්න පුළුවන්ද? සුළඟ කියන්නේ සෝතයක්, ගැලීමක්. දැන් සුළඟ සෝතයක් ගැලීමක් වගේම තමයි. ගඟ ගලනවා, ඒවගෙම තමයි මේ සිත මේ සිත කියන්නෙ ප්‍රවාහයක චිත්ත ප්‍රවාහයක්. ඒක සුළග වගේ, එකට අගක් මුලක් නෑ. ඒක සිතිවිලි සංසාරයක්. මේකෙ ගඟ කියල දෙයක් නෑ. ඇල්ලුවොත් අතට අසුවෙන්නේ වතුරනෙ, තෙත ගතියනේ. ගඟ කියල දෙයකුත් නෑනෙ. සුළඟ කියල දෙයකුත් නෑනෙ. අපි දාගත්ත නමක්නෙ. වැස්ස කියල දෙයකුත් නෑනෙ. ඇල්ලුවොත් වතුර ටිකක්නෙ, දාගත්ත නමක්නේ. මෙන්න මේ වගේ තමයි සිත කියල දෙයක් නෑ. ඒක ප්‍රවාහයක්. මෙන්න මේ අවබෝධය ඔබට තියෙනව. දැන් මේ ප්‍රවාහය දෘෂ්ඨියක්, මායාවක්, චිත්ත ප්‍රවාහයක්. එතකොට බුදුරජාණන් වහන්සේ පැහැදිලි කරනව ඍතු නියාම, බීජ නියාම, කම්ම නියාම, චිත්ත නියාම කියන නියාම ධර්ම මේක ලෝක ස්වභාවයක්. චිත්ත නියාමයක්. ඍතු නියාමයක්, වී ගහක ඇටයකින් ගසක් පැලවෙන ඒක, බීජ නියාම, ඍතු නියාම, කම්ම නියාම, චිත්ත නියාමය ඔය සිත හට ගැනීමේ ස්වභාවය.



www.buddothpado.com

දැන් මෙන්න මේ කෙනෙක්, පුද්ගලයෙක් , ආත්මයක්, කථාවක් මෙතන නැති බව ඔබ දැන් දන්නව. ඔබ දන්නව, ප්‍රභාස්වර සිත, ඔබ ඉපදුනෙ, අප සම්මුතිය තුළ කතා කරනවනෙ උපත, නමුත් ඔබ දන්න කෙනා ඔහොම නෙමේ හිතන්නේ, ආර්ය ස්වභාවය, ආර්ය භූමියේ ඔබ දැන් ආර්යයන් වහන්සේ නමක් නම්, එහෙම නැතිනම් ඔබ ආර්ය භූමියට ප්‍රවේශ වෙනව නම්, ඔබ දකින්න මේ, දැන් ඔබ ඔබ කියල කියන්නේ, මේ ආයතනවල උපත. ජාතිය කියන්නේ, ඇසේ උපත. 'ස්කන්ධානං පාතිභාවෝ ආයතනානං පඨිලාභෝ අය වුච්චති ජාති'. ස්කන්ධය නිසයි මේ ආයතන හරහා ජාති හැදිල තියෙන්නෙ. ආයතන හදාගෙන අපි ජාතියක් හදාගෙනයි ඉන්නේ. ඇත්ත කතාව. මේක හැදෙන එකක් අපි හදනව කිව්වම එතන ආත්ම කථාවක් තියෙනව. එතකොට මේ භාෂාවෙ තියෙනව මේ ආත්ම කථාවක්, භාෂාවෙන්නෙ අපිට කථාකරන්න වෙන්නේ මේක පෙන්වන්න. මේ මනසිකාරයෙන් ඔබට මේ සංඥාව දෙන්න එපෑයැ. සත්‍ය සංඥාව. මේක ඉතාම ගැඹුරුයි භාෂාවෙන් කථාකරන්න බෑ බොළඳයි. භාෂාවෙන් කියන්න බෑ. ඒකට හේතුව තමා භාෂාවට අන්තයක් තියෙනව, අන්තයක් නැති දෙයක් අන්තයක් තියෙන දෙයකින් විග්‍රහ කරන්නයි අපිට සිද්ධ වෙලා තියෙන්නේ. දැන් එතකොට ඇසේ උපත, කණේ උපත, මේ ආයතන වලින් එන අරමුණු පමණයි. වෙන දෙයක් නෑ. දැන් අපි කියනව අපිට මරණයක් නෑ කියල. දැන් මරණයක් නැති වෙන්නේ කොහොමද? සම්මුතිය තුල කථා කරනව, උපතක් තියෙනව මරණයක් තියෙනව, ශරීර කූඩුව පොළවට පස්වෙලා යනව ඒක මරණයක්. මේ සිත නැති නිසානෙ පොළවට පස් කරන්නෙ. සිතනේ මැරිලා තියෙන්නේ, ඕකනේ මැරිල

කියන්නෙ. සිතනෙ අර මව් කුසෙන් එළියට එනකොට සිත නැතිනම් මළකදක්නෙ. එතකොට ඒ ප්‍රාණවත්භාවයත් එක්කම සිතත් පහළ වෙනව. දරුවා හුස්ම ගන්නව කියල කියන්නෙ වායුව ඇතුලට එනව, වායුව ඇතුතට එනවත් එක්කම 'ලහුතා මුදිතා කම්මඤ්ඤදතා' කියල ස්වභාව ටික, ශුද්ධාෂ්ඨක ටික, ඒ රූප 28 ස්වභාව ටික, ඒ ඇතුලට මස් ගුලියට වායුව යාම නිසා ඇතිවන 'ඉලිප්සිම්, ජුප්ප්සීම්' තමා ඇත්තටම ඒ පණ තියෙනවා කියල කියන්නෙ. දැන් වායුව ඇතුලට ආවේ නැතිනම් ස්වරාලයෙන් ශබ්දයක් පිටවෙන්නෙත් නෑ. ඒ විතරක් නෙමේ රුධිර සංසරණයත් වෙන්නෙත් නෑ. ඒ විතරක් නෙමේ මේ අතක් පයක් ඉස්සීමක්, පිම්බීමක්, හැකිලිමක් මුකුත් වෙන්නේ නැ. එහෙම වෙන්නෙ නෑ කියල කියන්නේ දරදඬුයි දරකැල්ලක් වගේ, ගලක් වගේ, අර ඇතුලට හුස්ම යාම ආශ්වාස/ප්‍රශ්වාස සිද්ධ වීමම තමයි. ඇත්තටම මේ පණ ලැබෙන්න හේතුවෙලා තියෙන්නේ. ප්‍රාණවත් ස්වභාවය ඇතිවෙන්නෙ ඒ එක්කම තමා මේ ස්කන්ධ ඇති වෙන්න හේතු වෙලා තියෙන්නෙ. මේ එක එක සම්බන්ධයක් තියෙනවා. එතකොට මේ ස්කන්ධය කියන එකත් විඳීම්, දැනගැනීම්, හැඳිනීම්, කියලා කියන්නේ. මේවා වචනනේ. ඒ වචන වල වෙනින් අර්ථත් තියෙනවනේ. වේදනා, වේදනා කියනකොට සැප-දුක්නේ අපට හිතෙන්නේ. නෑ එහෙම දෙයක් නෑ. හැඩතල, හැඩතල ඒ හැඩතල දැනෙන්නෙත් සංඥාවකින් තමයි දැනෙන්නේ, රස්නයත් සංඥාවකින් දැනෙන්නේ. ශබ්දයත් සංඥාවකින් දැනෙන්නේ. වර්ණයත් සංඥාවකින් දැනෙන්නේ ඒ සංඥා, සංඥා, කම්පන/චංචල කිව්වත් හරි. භාවනා කරන කොට හුස්ම නොදැනෙන තැනට යනකොට කම්පන චංචල

දැනෙනවනේ එහෙම කිව්වත් හරි. අන්න එතනම තමයි ආශ්වාශ-ප්‍රාශ්වාශ තමයි. කාය සංස්කාර වලට යටින් තියෙන්නේ, විතක්ක විචාර තමා වචී සංඛාර වලට යටින් තියෙන්නේ. වේදනා සංඥා තමා මනෝ සංඛාර වලට යටින් තියෙන්නේ. දැන් අපි කියනවනේ සංඛාර වලට කාය සංඛාර, වචී සංඛාර, මනෝ සංඛාර කියලා දැන් ධම්මදින්න පෙන්වන්නේ ඔය තුන. එක පැහැදිලි වෙනව හොදටම. විසාක උපාසකට පෙන්වන්නේ ඔය තුන. ඒකම තමා අපි කියන්නේ මේ කර්ම පථයක්, පින් පව්, කුසල් අකුසල් කර්ම මෙවා විපාක දෙනවා, එතකොට තමයි කාය සංඛාර, වචී සංඛාර, මනෝ සංඛාර එක්ක තියෙන්නේ. එතකොට ලෝභ, ද්වේශ, මෝහ කියලා ගන්නේ. නමුත් එක පැහැදිලි කිරීමක් කථා කරනව. දැන් ප්‍රායෝගික පැත්තට හැරුනහම කර්මය පැත්තට යන්නේ නැහැ. මේ මාර්ගයේ එන කෙනා දකින්නේ හේතුඵල දහම. මේ සත්‍ය දකිනවනේ, ඒ ධර්මය අවබෝධ වුන කෙනා කියලා කියන්නේ දර්ශනයට පත්වුන කෙනා කියලා කියන්නේ, දකින්නේ ධර්මතාවය 'ඉමස්මිං සති ඉදං හෝති ඉමස්මිං අසති ඉදං නහෝති'. ආලෝකයක් තිබුණොත් පෙනීමක් තියෙයි. ආලෝකයක් නැතුව මෙතන හැඩතලයක් එන්නේ නෑ. චක්ඛු ප්‍රසාදයට එන්නේ නෑ, දැන් ආලෝකයත් ගසත් නිසා ඇතිවුන ප්‍රතිබිම්භයක් අන්ධකාරයේ අපට පේන්නෙ නෑ එතකොට අපි දැන්මේ කථා කරන්නෙ සිත ගැනනෙ. එක උපමාවක් ගත්තොත් උදාහරණයක් හැටියට, ඇස ගත්තොත් එතකොට එතන ආලෝකයත් ගසත් නිසා ඇතිවන සෙවනැල්ල තමා 'තිණ්ණං සංඝති ඵස්සො' කියල කියන්නේ. 'චක්ඛුංච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංඝති ඵස්සෝ'. මේක තමයි



www.buddothpado.com

පෙන්වන්නේ පෙළ දහම, මහා නිදාන සූත්‍රය, සළායතන සූත්‍ර වල පෙන්වනවා මේ සිත හැදෙන හැටි එතකොට ඇස දන්නෙ නෑ මොකද්ද කියන එක. එහෙම තමයි පෙන්වන්නෙ, කැමරාවකින් ෆොටෝ එකක් ගන්නව වගේ තමා උපමාවකින් පෙන්වන්නෙ. එතන හැඩතලයක් කිරණයක් විතරයි. මේ අර කණ්ණාඩිය අව්වට දිලිසෙනව වගේ කථාවක් ම තමයි. එතකොට ඒ පෙල දහම තමා අපිට පෙන්වන්න සිද්ධවෙලා තියෙනව, පොඩ්ඩක් අපි මේ පෙන්වන්නෙ ඉස්මතු කරල ගන්නෙ ප්‍රායෝගික පැත්ත පෙන්වන්නයි. ප්‍රායෝගික පැත්ත තමා අපිට වැදගත් වෙන්නෙ. එතකොට දැන් අපි මේ දැනගන්නව මෙතන ස්වභාවික සිද්ධියක් තියෙනව දැන් අපි කීව ආලෝකයට ශබ්දය එකතු වීම තමයි අර අම්මගේ හැඩතලය එනවිට මා, මා, කියල ප්‍රතිකම්පනයක් හැටියට තමයි ස්වරාලයෙන් ශබ්දය පිටවෙන්නෙ. උඩ අහසෙ විදුලි කොටන කොට මෙහෙ ජනේල් හෙල්ලෙන්නෙ ප්‍රතිකම්පනය වෙන්නෙ ඒ තරංග සමාන ස්වභාවයටනේ. එතකොට එතන ඉදන් මෙතෙන්ට ඇවිල්ල නෙමේනෙ. එතන අංශු එතන සකස් වෙනව මෙතන අංශු මෙතන සකස් වෙනව ඒකම තමයි අම්ම අම්ම කියන කොට ස්වරාලයෙන් ප්‍රතිකම්පනයක් සිද්ධ වෙන්නෙ. බාහිරින් එන කම්පනයට ප්‍රතිකම්පනයක් මෙතන ස්වාභාවයෙන් සිද්ධ වෙනව. එතකොට ඒක තමයි මා මා මා කියල, අම්මා කියලා ශබ්දය පිට වෙන්නේ එතකොට බාහිර තිබුණ ශබ්දයමයි පිටකරල තියෙන්නෙ. 'අවිජ්ජා පච්චයා සංඛාරා කියන්නෙ මේක නොදන්නකම සංඛාරා කියන්නෙ අපිම දෘෂ්ඨියට කොටුවෙන හැටි, ඒ කියන්නේ මායා බන්ධනයක් සිදු වෙනව. බන්ධනයක් කියල කියන්නෙ සම්මුති වචන. නමුත් මෙතන ස්වභාවික සංසිද්ධියක් සිදුවෙනව.

හැඩතලත්, ශබ්දත් එක්කම එක්කම මේ අනිත් ඒවත් ගැට ගැහිල තියෙනව. ගන්ධ මේ හැම එකම, ආයතන හයම ගැට ගැහිලයි තියෙන්නෙ. එතන 'අම්ම' කියන කොට ඒ ඔක්කොම තියෙනව, ඒ හැඩතලයට හැඩයට ඒ ශබ්දයට විතරක් නෙමේ, සුවඳිනුත් ඒ අම්මව මතක් වෙනව ඔබට එක දැනෙයි. සුවඳින් රසින් පහසින් ඒ අම්මව මතක් වෙනව. එතකොට ඒ හැඩතලය රූපය එනව එළියට, රූපය සුවඳිනුත් එනව, ශබ්දයෙනුත් එනව, දැන් කවුරුහරි ඔබට අම්ම කියල කෝල් එකක් දුන්නොත් අම්මගේ රූපය මතක් වෙනව, සිතට මැවෙනවා මේ චිත්ත මායාව හැදිල තියෙන්නේ එකතුවෙන්. ඒකයි මේක 'සක්කාය දෘෂ්ඨි' කියල කියන්නෙ කාය කියන්නේ මේ ගොඩ. එක රූපාරම්මණායකම මේ කාය ගොඩ තියෙනව 'සක්කාය' ශබ්දයෙත් තියෙනව ඒකෙන් තමා කාය ගොඩ හැදිල තියෙන්නෙ. දෙයක් බවට පත්වෙලා තියෙන්නෙ මෙතන කාය, ගොඩ එකතු වෙලා තියෙන එකත් 'කාය' දෘෂ්ඨියක්, එහෙම දෙයක් නැහැ. මේක තමයි පෙළ දහම, ඔබ දැනගත්ත දැනුම. දැන් අපි මේක එන එන සිතට පෙන්වන්න ඕන. මේකමයි ස්කන්ධයක උදය-වැය දකිනව කියල කියනන්නෙ. එතන, එතන, එතන ඔබ දන්නව 'තත්‍ර තත්‍ර විපස්සති' ඔබ දන්නව ධර්මය තුල දැන් මේව ඉගෙන ගත්ත. තත්‍ර තත්‍ර විපස්සති එතන එතන මේක පෙන්වන්න ඕන.

'සීලෙ පතිට්ඨාය නරෝසපඤ්ඤෙදා-චිත්තං පඤ්ඤඤත්ත භාවයං ආතාපි නිපකෝ භික්ඛු-බෝ ඉමං විජිකයේ ජඨං' කියලා කීවේ ඒකනේ. මෙකට ඕන සීලයේ පටිච්චාය, මේ සිත දුවනවනම් මේක දකින්න බෑ. දැන් අපි ප්‍රතිපදාවට එනකොට අපි දැන් මේ එක්ෂණික අරමුණක් ගලව ගන්නනෙ ඕන. එක සිතක් උපදින නැතිවන හැටි දැක්කොත් ඒ තමයි අපි අපේ



www.buddothpado.com

ජීවිත කාලයේ අවසානයේ එක සිතයි උපදින්නෙ. ඒ සිත ඉපිද නිරුද්ධ වන එකට තමයි මරණය කියල කියන්නෙ. ඒකට චුති සිත කියල කියනවා. නමුත් මේ මොහොතෙත් ඒ සිතම උපදිනවා. මේ මොහොතේ සිතක්ම තමා උපදින්නේ. මේ මොහෙතේ උපදින සිතේ ඇත්ත දැකල මිදෙනවා කියලා කියන්නේ අවසානයේ ඔබ මැරෙන දවසටත් ඒ සිත දැකල මිදෙන එකම තමයි. මේ අඹ ගහේ කොල දාහක් පන්දාහක් තිබුණාට ඒක අඹ කොළයක් අරගෙන නාරටිය බැලුවොත් ඔක්කොම අඹ කොළ එකයිනෙ. එතකොට මේ හට ගන්න හැම සිතක්ම එකම ස්වභාවයක් පවතින්නෙ. එක සිතක් අවබෝධ කරන්නයි ඕන. ඒක්ෂණික සිතේ උදය-වැය දකින්නයි කියල කිවෙ ඒකයි. උදයව්‍ය ඥාණය දකින්න ඕන මේ ක්ෂණික සිතේ. ඉතිං මේ එක අරමුණාක සත්‍ය දකින්නයි බැරුව ඉන්නෙ. එතනට තමයි අපි දැන් මේ සමථය ගන්නෙ. දැන් ඔබ සීලයක පිහිටාගෙන ඉන්ද්‍රිය සංවරය ඇති කරගෙන ඔබ මේ මාවතට එනකොටම, ඔබ විවිධාකාර, සමහර විට මූලිකව එක එක දේවල් වලට පුරුදු වෙලා ඇති. සමථය වඩල, සිල් රැකල, ඒවගේ ගොඩක් දේවල් කරල ඇති. සම්මුතිය තුළ, සමාජමය කටයුතු තුල, දැන් අපි මේවා පිළිවෙලට සකස් කරගෙන අපේ මිදීම ඇතිකර ගන්න ඕන. අපි නිවන් දකින්න ඕන. එහෙමනම් දැන් අපිට තියෙනව කතිකාවතක් දැන් මෙතෙන්ට ආපු අයට තියෙනව කතිකාවතක්. දැන් අපි දකින්නේ මොකද්ද එක සිතක් හටගෙන නිරුද්ධ වන හැටි. මේක ස්වභාවික සංසිද්ධියක්. මෙතන සිතක් කියල දෙයක් නෑ. ජේන බව විතරයි, ජේනව කියන සිත ගත්තොත් දැන් මෙතන අර පොත කියන උදාහරණය ලෙස ගත්තොත් පොත කීම පමණාමයි සිත කියල

කියන්නේ. දැන් මේක තමයි දර්ශනය, බුද්ධ දර්ශනය අනුව පොතමයි තමා තමන් වෙනයි පොත වෙනයි කියල දෙයක් නෑ. මම මෙතන ඉන්නව මට පොත පේනව කියල එකක් නෑ. පොතමයි මම, ඉස්සරහ මේසය නම් මේසෙමයි මම, තමත් වෙනයි පොත වෙනයි කියල දෙයක් නෑ. ඉස්සරහ බිත්තිය නම් බිත්තියමයි මම, මම කියල දෙයක් ඇත්තටම නෑ මෙතන. පේන බව පමණයි, ඇසෙන බව පමණයි, දැනෙන බව පමණයි. දැනීම දැනීමක් පමණයි කීවෙ එකයි 'දිට්ඨෙ දිට්ඨ මත්තං' කීවෙ ඒකයි 'සුතේ සුත මත්තං' කීවේ. ඒකයි 'මුතේ මුත මත්තං' කීවේ. 'විඤ්ඤාතෙ විඤ්ඤාත මත්තං' කීවෙ එපමණයි තියෙන්නෙ. දැන් මේක තමයි අපේ දැනුම. දැන් අපි දන්නව පොතමයි මම කියන්නෙ කියල දැන් අපි දන්නව මේසෙමයි මම කියන්නෙ කියල. දැන් මේ දැනුම ඔබට තියෙනව. දැන් ඔබට ගැටලුවක් තියෙනව දැන් අපි කොහොමද මේක ප්‍රත්‍යක්‍ෂ වෙන්න පුහුණු වෙන්නෙ කොහොමද ඔතනනේ ගැටලුව තියෙන්නෙ, ගොඩක් අය අපෙන් ප්‍රශ්න කරන්නෙ. මේ ස්කන්ධයේ උදය-වැය දකින්නයි කියනව. ප්‍රායෝගිකව අපට පුහුණු වෙන ක්‍රමයක් අපිට කියන්න, හරියට අපිට එක එක්කෙනා, හරියට දේවල් කියනව. අර බුදුරජාණන් වහන්සේට කියනව වගේ නමුත් ඔබට නිවැරදිව ප්‍රත්‍යක්‍ෂතාවයම අවබෝධයම තියෙනවා නම් ඔබ ඒක ඉදිරිපත් කරන්න තියන්නේ. එතකොට අපි උත්සාහයක් කරනව ඔබට එය ඉදිරිපත් කරන්න. අපි කියනව මෙන්න මෙහෙම. අපි පුහුණුවුන ආකාරයට මේකට මූලික දේ තමා අපි ඔබට දීර්ඝකාලයක් තිස්සෙ කරපු දෙය එක දවසින් එක මොහොතින් කීවට ඔබට, අපි දීර්ඝ කාලයක් තිස්සේ ඒවත් එක්ක දියවුණා දියවීම් තියෙනව, ඒවත් සමග ලොකු

දියුණුවක් තියෙනව සිතෙන් ගැලවුණ දියුණුවක් තියෙනව, ඒ නිසා අපට පහසුවක් තියෙනවා. ඒක සමහර විට ඔබට නැහැ. ඒනිසා ඒක ඔබට එක පාරටම කීවාම ඔබ මේක බොහොම පරිස්සමින් ඔබ අහන්න ඕන. මේක ඉතාම ගැඹුරුයි මේ කථා කරන කාරණා ඇත්තටම දීර්ඝ සසරක අවසානයට එන්න හදන්නෙ. ඔබගේ මේ සසර ගමනේ අවසාන මොහොතට මේ එන්න හදන්නේ ඉතින් ඔබ මේ තාක් ඔබගේ චිත්ත ස්භාවයට හේතු තියෙනව නම් ඒ සියල්ල බිඳ වැටෙන තැනට තමයි. ඒ උතුම් මොහොතට තමයි ඔබ මේ අවදිවෙන්න හදන්නේ. ඒ උතුම් මොහොතට අවදිවන කාරණාව මංගල කාරණාවක් නැවත ඔබට කාථාවක් නැ. මේ මරණය ඔබ මරණය අත් විදින්න හදන්නෙ. තව විදිහකින් කියනවනම්, තව මරණයක් කියලා එකක් නෑ, අද සමාජය තුල මරණය කියල කියන්නේ මහ භයානක භය හිතෙන භීතියක් ගෙනදෙන දෙයක්නේ. එහෙම එකක් නැහැ මේකේ මේ මරණය අති සුන්දර මරණයක්, අතිසුන්දර නිදහස් වීමක්, මේ කුරුල්ලෙක් කූඩුවෙන් නිදහස් වුනා වගේ. මේ ස්වභාදහම බවට පත්වීමක්. සිත වීසිරීමක් ඒ කියන්නේ සිත එකතුවෙලා (හැක්) වෙලා, මේ ඉන්නේ හිරවෙලා ඔබ එතනින් ඔබ ලෙහිලා නිදහස් වෙලා එළියට යනවා. ඔබට මහා සැහැල්ලුවක් සහනයක් ඒ තුළ දැනෙන්න ගන්නව. එතෙන්නට තමා මේ ප්‍රායෝගික පැත්ත කථා කරන්නේ. එතකොට දැන් ඔබ දන්නව, මේ එක සිතක් දකින්නයි මේ උත්සාහ කරන්නේ. ඒ වෙනුනේ අපි විශාල කටයුත්තක් කරනව, බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍යම පෙන්වන්නේ මේ එන අරමුණ සත්‍ය කරගැනීම. සමුදය: මේ මොහොතේ එන අරමුණ, පොත දැකීම නම්, ඒ පොත කියල එන අරමුණ,



www.buddothpado.com

ආරම්භනය, අරමුණ පොත ඇත්ත වුණා කියන්නෙම සමුදය, පොතක් බාහිරයේ තියෙනව ඇත්තක් කියලා ගත්තොත් එය සමුදය. එතකොට එහෙම වුනොත් ඔබ රැවටිලා, බාහිර පොතක් හමුවෙලා, එහෙම උනොත් ඔබ ඒකට ඇලෙනවා ගැටෙනවා සැප දුක් කියලා කර්මය සකස් වෙනවා ලෝභ, ද්වේශ, මෝහ සිත් සකස් වෙනවා. තණ්හාව උපදිනව ආශාව උපදිනවනේ බාහිර පොතක් තිබ්බොත් එකට ඇලෙනව හෝ ගැටෙනවා. එහෙම උනොත් තණ්හා, උපාදාන, භව, ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, එනව. එතනට යන්නේ නැතිව ඔබ කොකොමද දැන් සත්‍ය දකින්නේ. මෙතන මේ එන අරමුණේ සත්‍ය දකිනවනම් එහෙම දෙයක් බාහිරයේ නෑ. පොත කියන්නේ සම්මුතියක්, තමන්ගේම හිතේ හදාගත්ත සිතුවිල්ලක්. ඒ සිතුවිල්ල, සම්මුතිය, බාහිර නොවේ කියල ඔබට ඒ නුවණ තියෙනවනම් ඔබට ඒ ධර්මය ඇසුණ නම් ධර්මය ඇසුණ කෙනාටයි, දන්න කෙනාටයි, කරන්න දෙයක් තියෙන්නේ. සත්‍ය ඥාණය ඇත්තවුනටයි කෘත්‍ය ඥාණය තියෙන්නේ එයාටයි කෘතක් ඥාණය තියෙන්නේ. මේ එක්ෂණික සිතම, මේ සිත දකින තැනම පොත බාහිර නෙමෙයි. මේ සිතමයි කියලා මේ සිතම තමයි කියලා ඔබට ප්‍රත්‍යක්ෂකමක් තියෙන්න ඕන. එන එක සිතකින් මිදුණා කියන්නේ සියලු සිතුවිලි වලින් මිදුණ බවක් දකින්න ඕන. එතකොට ඔබට ලොකු අවබෝධයක් තියෙන්න ඕන. මේ පොත කියන සංඥාව පෙර සංඥාවක් දැන් එහෙකුත් නෙමෙයි, මේ මොහොතේ එන සිත හැර වෙන දෙයකුත් නෑ. මොහොත පමණයි තියෙන්නේ මෙහොත කියලා දෙයකුත් නැහැ මොකද පොත කියලා දෙයකුත් නැති නිසා ඒ දෙකම නැතිවෙනව එකවර. ශුණ්‍යතාවය තමා ඔබ ඊට පස්සේ

දකින්නේ. දැන් මේක දැණුම ඊට පස්සේ ඔබ පොතෙන් මිදිල. බාහිර පොතක් හමුවෙන්නෙත් නෑ. ඒ අරමුණ එතනින්ම මිදෙනවා එතන ශූන්‍යත විමුක්තියක්, අනිමිත්තයි, නිමිත්තක් හමුවෙන්නෙත් නැ. අන්න ඔබ අනිමිත්ත ශූන්‍යත අප්පණිහිත චේතෝ විමුක්තියට එතනම පත්වෙනවා. ඒ තමයි හුදෙකලාව, එ තමයි ශූන්‍යතාවය, එකමයි බුද්ධ ස්වභාවය දකිනව කියන්නෙ, එතනමයි ඒ සේරම තියෙන්නෙ. එතනමයි කෙලෙස් ක්‍ෂය වන තැන. 'ආසවක්ෂය ඥාණය' උපදින්නෙ මෙතන සිත් පරම් පරාව දැකීම 'පුබ්බෙ නිවාසානුස්ති ඥාණය' 'චුතූපපාත ඥාණය' මේ එක සිතේ ඇතිවීම නැතිවීම දැකීම, ත්‍රිවිද්‍යාත් මෙතනමයි තියෙන්නෙ. මේ චතුරාර්ය සත්‍යයත් මෙතනමයි තියෙන්නෙ සතර සතිපට්ඨානයත් මෙතනමයි තියෙන්නෙ. ආර්‍යඅෂ්ඨාංගික මාර්ගයත් මෙතනමයි තියෙන්නෙ පටිච්ච සමුප්පාදයත් මෙතනමයි තියෙන්නෙ. එක් ක්‍ෂණික සිතේ මේ සියල්ලම තියෙනව, මුළු ධර්මයම තියෙනව. එතකොට මේ මෙතනම එකින් එක මෙතනම දකින්න පුරුදු වෙන්න ඕන. එතකොට මේ සියල්ලම එක්ක්‍ෂණික සිතේ දකින්න පුරුදු වෙන්න ඕන එතකොට සමුදය, පොතේ හටගැනීම දැක්ක, පොතේ ඇත්ත දැක්කනම්, එතන පොත හටගත්තොත් ඔබට දුකක් එනව එක්කෝ 'සැපදුක්ඛං, දුක දුක්ඛං' එය සැපයි දුකයි දෙකම දුකක්ම තමයි. ඒ දෙකම විඳීමක්, වේදනාවක් එනව ඒ දුක හේතු වෙන්නේ සමුදයෙන්, පොත හට ගැනීමෙන් අපි ඒකෙ සත්‍ය දැක්කොත් ඒක නිරෝධයට යනව පොත හමුවෙන්නෙ නෑ. දැකීම තමා ප්‍රතිපදාව වෙන්නෙ එක තමා මාර්ගය එතනට යන්න තමා දැන් අපි උත්සාහ කරන්නේ කොහොමද දකින්නෙ කියලා. දැන් මෙතන තියෙන්නේ අවබෝධ

ශ්‍රද්ධාණයක් ‘සංබිත්තේ නිබ්බදා, අවබෝධයෙන් නිවන් දකින්නෙ, එතකොට මෙතන තියෙන්නෙ ඔබගේ ප්‍රඥාව වැඩි වෙන්න ඕන. ඒ කියන්නෙ ඔබ මේ සත්‍ය දකින්නයි ඕන, එතකොට ඔබ මේ හැමදේම කරන්නෙ සත්‍ය දකින්නයි. ඒකයි බණ අහන්න කියන්නෙ. එකයි බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරන්නෙ. මේ පැහැදිලි කරන්නේ බුදුරජාණන් වහන්සේ හැමෝටම පැහැදිලි කරන එකයි කරන්නෙ. ඒ තුල ඔබ දන්නව රහත් වෙනව කියල ඒකයි ඇත්ත කථාව නමුත් ඔබ සතර ඉරියව්වේම ධර්මය දකින්න ඕන, ඇත්තම කීවොත් ඒකමයි භාවනාව දැන් කොහොමද මේක එදිනෙදා සතර ඉරියව්වේ දී දකින්නෙ. ඔබට මේක විවිධාකාර පැතිකඩ වලින් පෙන්වන්න පුළුවන් අද අපි දකිනව සමහර අවස්ථාවල විශේෂයෙන් දියුණු භික්ෂූන් වහන්සේලා, ගිහියන් මේ ආධ්‍යාත්මිකව දියුණු අය ඒවාගේ කටයුතු කරන අය හෙලිකරනව විවිධාකාර පැතිකඩයන් ඔස්සේ තම තමන් හදාගත්ත උත්සාහයන් තුළ සිතෙන් මිදෙන්න දරන උත්සාහය අපට පේනව. එය ඉතාම වැදගත් ඒ හැමෝටම අපි ඇත්තටම සාධු කියනව. සාධු සාධු කියල. ඒ කියන්නෙ ඒ හැමෝම උත්සාහ කරනව දෙයක් කරන්න උත්සාහ කරනව වරදින එක සාමාන්‍ය ස්වභාවයක්. වැරදිලා තමා හැමෝම හදා ගත්තේ, හැමෝම උත්සාහ කරනවනම් ඒ උත්සාහය අගය කරන්න ඕන. යමක් යමෙක් උත්සාහයක යෙදෙනව නම් එය අගය කල යුතුයි නේ. දැන් මෙතන නිවැරදි කළ යුතුයි. දැන් සමථයත් අවශ්‍යයි. විදර්ශනාවත් අවශ්‍යයි. ඒකට හේතුව දැන් ඔබගේ සිත විසිරෙනකොට ඔබට පේන්නේ නෑ අරමුණ, හිත දුවනව ඒක තමයි ගොඩක්ම තිබෙන ගැටලුව හැමෝටම තියෙන ගැටලුවක් තමා හිත දුවනව, හිත

විසිරෙනව, හිත දකින කොට හිත ගිහින් ඉවරයි. කොහොමද මේ සිත ඒ මොහොතේම දකින්නේ. ඒක තමයි කුසලතාවය, ඒක තමයි කුසලයේ පිහිටුවනව කියල කියන්නේ. ඒක තමයි 'සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා' කියල කියන්නෙ සිත දිවීම තමා. 'සබ්බ පාපස්ස අකරණං ඒ සියළුම එන සිත් අකුසල් දුවන සිත් අකුසල් සිත් රාග, ද්වේශ, මෝහ සිත් තමයි ඒ දුවන්නෙ. 'කුසලස්ස උපසම්පදා' කියන්නේ ඔබ මේ දකින්න උත්සාහ කරන එක. ඒක තමා කුසලය ඒක තමයි උපසම්පදා ඒකතමයි සචිත්ත පරියෝ දපනං සිත දමනය කරගන්න ඕන. මෙයයි සියළු බුදුවරුන්ගේ අනුශාසනාව මේක තමයි ඒතං බුද්ධානු සාසනං කීවෙ.

බුද්ධ කියල කියන්නේ ඔබ දැන් දකින්න. අපි දැන් කථා කරන්නෙ බාල බොළඳ පෘථග්ජන භූමියේ ඉන්න අයට නෙමේනෙ. මේ ධර්මය තුළ ඉන්න අයටනේ එහෙනම් මේ බුද්ධ කියල අපි දකින්නෙ මොකද්ද? අපි දකින්නෙ 'එම්ටිනස්' එකක් ඒ කියන්නේ අපි දකින්නෙ හුදකලාවක් අපි දකින්නේ ඇත්තටම කීවොත් මේ සම්මුති ප්‍රඥප්ති දැන් ඔබ එළිය බලනව. ඒ බලන කොට ඔබට පේනව බිත්තිය පොළව අහස ගස් පේනවා දැන් මේ පේනව කියන එකක්නේ තියෙන්නේ ඔබට මේ ඉදිරිපත් කරන්න හදන්නෙ දර්ශනය කියන එක පේනව කියන තැන දර්ශන තලයක් ඔබට පේනවනේ. දැන් මේ දර්ශන තලයට එහා ගිය තලයක් ඔබට පේන්න ඕන. මේ දර්ශන තලයෙ තියෙන්නෙ සම්මුති නාම, අහස තියෙනව පොලව තියෙනව මේ ඔක්කොම සිතිවිලි තියෙන්නෙ මේ සිතිවිලි වලින් හදාගත්ත රූපයක් ඔබට පේන්නේ එළිය බලනකොටම. හැබැයි ඒක නෙමෙයි ඇත්ත ඒවා සිතිවිලි. අහස කියන්නේ සිතිවිල්ලක්, අඹගහ කියන්නේ සිතුවිල්ලක්,

මේසෙ කියන්නෙ සිතිවිල්ලක්, මේ සියල්ල සිතුවිලි ගිනි ගත්තොත් මේ සියල්ල ගිනි ගන්නවනෙ මේසෙත් ගිනිගන්නව ජනේලෙත් ගිනිගන්නව අඹ ගසත් ගිනිගන්නව. අන්තිමට සතර මහ භූත ඔක්කෝම ගිනි ගන්නව. එහෙනම් අපිට අර සතර මහ භූත පේන්න ඕන. ඒ කියන්නෙ සතර මහ භූත පෙන්න ඕන කියන කථාවක් නෙමේ. මේ සත්‍ය ඔබට දෙන්න අපි භාෂාව භාවිතා කරනව විතරයි. එකට ගැටෙන්න එපා භාෂාවක් එක්කල අපි අදක්ෂ වෙන්න පුළුවන් සමහර විට අපි මේ භාෂාවෙන් ඉදිරිපත් කරන්න අදක්ෂ වෙන්න පුලුවන්, නමුත් කරන්න දෙයක් නෑ භාෂාවෙන් අපි කොහොම හරි ඔබට මේක ඉදිරිපත් කළ යුතු වෙනව. අපි මේ දර්ශනය දකිනවා ඔබත් දකින්න ඕන. අපි දර්ශනය දකිනව නැත්නම් මෙහෙම කියන්නෑනෙ අපි දර්ශනය දකිනව ඒ දකින දර්ශනය ඔබත් දකින්න ඕන. මොකද්ද අපි දකින දර්ශනය, අපි දකින දර්ශනය මේකයි, හරියට අර චිත්‍රපටියේ තිරයක් තියෙනව ෆිල්ම් හෝල් එකේ තිරයට උඩින් ලයිට් එක ගහනව ප්‍රොජෙක්ටර් එකට, ප්‍රොජෙක්ටර් එකෙන් ගැහුවාම එකේ කිරණ වලට අර තිරය මත වැටෙනව රූප ටික අර ටී වී එකේ වගේ හැබැයි තිරයට එහා පැත්තෙ පසු තලයක් තියෙනව. අපි දකින්නෙ තිරය නෙමේ අපි දකින්නෙ පොල්ගස් අඹගස් මිනිස්සු වාහන ගෙවල් ඒවා දකින්නෙ. හැබැයි ඒවා තිරයේ නැහැ. ඒවා අර තියෙන වර්ණ, අපේ හිතේ වර්ණ තමයි අපි දකින්නේ, අපි ෆිල්ම් එකක් දිහා බලාගෙන ඉන්නවා. නමුත් අපි තිරයක් දිහා බලාගෙන ඉන්නවා, මේකම තමයි ඔබ ටීවී එකේ දකින්නෙත් දැන් මේකම තමා ඇත්ත ලෝකයේ ඔබ එළියේ දකින්නේ නෑ. ඔය ඔක්කොම සිතිවිලිනෙ දකින්නේ දැන් ඔබ අර සිනමා පටියෙ තිරය වගේ දකින්නෙ තිරය අපිට

පේන්නෑනෙ අපිට පේන්නෙ අර ඒකට වැටුන චිත්‍ර ටිකනේ. ඔබ පසුගිය කාලයේ දකින්න ඇති තාප්පවල ලස්සන ඒව ඇන්ද. එතකොට ගොඩක් අය බැලුවේ තාප්පෙ නෙමේ, තාප්පෙ ඇඳපු දේවල්. එතකොට ඒ ගොල්ල දැක්කෙ තාප්පයක් නෙමේ ඒ ගොල්ලෝ දැක්කෙ වෙනත් වෙනත් හැඩතල. මෙන්න මේ වගේ චිත්‍රයක් තුළ ඔබ දකින්නෙ වෙනත් කථාවක් පොල්ගස් නාගස් ඒ වගෙ ඡායාව දකිනව. හැබැයි ඔබ තාප්පෙ දකින්නෙ නෑනෙ. මෙකේ පසුබිම දකින්නෙ නෑනෙ. මෙන්න මේ වගේ ප්‍රභාස්වර සිත කියල කියන්නෙ 'ප්‍රභාස්වරං චිත්තං' කියන්නෙ ක්ලේශයෙන් පස්සෙ කිලුටු වුනා කියන්නෙ, සුදු රෙදි කඩ කිලුටු වුනා කියන්නේ ඕන්න ඕකටයි. අපි හදාගත්ත චිත්‍රය අපි විසින් හදාගත්ත සිතිවිලි චිත්‍රයක් තියෙනව, අපි ජීවත් වෙන්නේ අපි හැමොම, මේ ලෝකයේ කෝටි අටසියයක ජනගහනය ඉන්නවානම් ඒ කෝටි අටසියය (800) මනුෂ්‍ය ජනගහනය සිත ඇතුලෙ ලෝක හදාගෙන ජීවත් වෙනව. ඒව චිත්‍ර ලෝක ඒව එකක්වත් ඇත්ත නෙමේ. ඔවුනොවුන් ඔවුනොවුන් කතා බහ කලාට සංනිවේදන කලාට ඇත්ත නෙමේ ඒව සේරම මායාවක් ඒ සේරම මැරෙනව ඒ සේරම පොළවට පස්වෙන ශරීර කූඩු ටික ඔය ඔක්කෝටම හිතාගන්න බැරි එකක් ඒක. ඔය කෝටි අටසියම බිඳ වැටෙනවා පුස්සක් වෙනව එකට හේතුව ඔය කෝටි අටසියම රැවටිල ඉන්න නිසා. සත්‍ය නොදන්න නිසා, එහෙම නම් මේකෙ සත්‍ය කුමක්ද? බොහොම ටික දෙනාටයි මේ සත්‍ය හමු වෙන්නෙ. ඒ කියන්නෙ ඔබට මේ පේන සිතිවිලි දර්ශන පථය මකල ඔබ ලෝකය දකින්න ඕන. දැන් මේක දකින්නයි ඔබ භාවනා කරන්නෙ දැන් මේක සතර ඉරියව්වෙම කරන්න ඕන. දැන් කොහොමද ඔබ මේක දකින්නෙ දැන්

දකින්න ඕන දේ ඔබ දන්නව. සිතක් එනකොට ඒ සිතේ පිංතූරය නැතිව දකින්න ඕන. දැන් චිත්‍රය තුල කොලය දකින්න ඕන ඇඳපු චිත්‍ර ටික නැතිව. දැන් ඔබ සිනමාහලේ දර්ශන පථය දකින්න ඕන. අර තිරය මත වැටෙන රූප ටික නැතිව. අන්න ඒක තමයි නිවන් දකිනව කියන්නෙ, ඇත්ත පේනව කියන්නෙ ඒකට, ධම්ම චක්කුෂය පහල වෙනව කියන්නෙ ඒකට, යථාභූත ඥාණය උපදිනව කියන්නේ ඒකට. යථා ස්වභාවය දකිනව, භූත වෙන හැටි දකිනව, අන්න ඒ කෙනාමයි අවිද්‍යාව ප්‍රහීන කලා වෙන්නේ. එයා රැවටිලා නෙමේ ඉන්නෙ චිත්‍රයට. එයා විද්‍යාව පහල කර ගත්ත කියන්නෙ ''ආලෝකෝ උදපාදි" ''විද්‍යා උදපාදි" ''චක්කුං උදපාදි" කියන්නෙ අන්න ඒ කෙනාට. ''ප්‍රඥා උදපාදි'' දැන් මේ කථාව ඔබ දන්නව, දැන් තව ටිකක් අපි ඒක හොඳට ඉස්මතු කලා. දැන් මේක ප්‍රත්‍යක්ෂ කරන්න ඔබ දෙන්න ඕන විශාල අරගලයක්, වීරියක් ඕන, ශ්‍රද්ධා වීර්ය සති සමාධි ප්‍රඥා තමයි. ශ්‍රද්ධා කියන්නෙ මේ සත්‍ය දකිනව තිරය දකිනව පසුබිම දකිනව. හදාගත්ත චිත්‍රපටය දකිනව එළියෙන් හදා ගත්ත. එතකොට ශ්‍රද්ධාව කියන්නෙ මෙන්න මේ කෙනා, සද්ධානුසාරි, මේ දකින කෙනා සත්‍ය දකින කෙනා. එතකොට වීර්යය කියන්නෙ මෙයා විර්යයක් ගන්න ඕන මේක බලන්න, එන එන සිතේ සත්‍ය දකින්න. සතිය කියන්නෙ ඊට පස්සෙ එයාට හැම තිස්සෙම පසුතලය පේනව, සතිය වැඩිවෙනව. අන්න සමාධිය උපදිනව, පසුතලය පේනව සමාධියක් උපදිනව, පසුතලය පේන්නේ අන්න එළියෙන් පේන වර්ණ ටික නැතුව කෙලින්ම පසුතලය පේනව. ඒ සමාධියක් උපදිනව පසුතලය පේන්නෙ. අන්න සද්ධා වීරිය සති සමාධි ප්‍රඥා ඒ මහා ප්‍රඥාව, අවබෝධ ඥාණයක්. ධම්ම චක්ඛුෂය අවදි

වුණා කියන්නෙ ''තර්ඩ් අයි" කියන්නෙ ඒ කතන්දර ඒ ඔක්කොම භාෂාව, නමුත් මේකේ ඔබට දෙයක් දැනෙනව, මේ සංඥාව දැනෙනව ඔබ සත්‍ය දකිනවා කියන්නේ ඕකටයි. දර්ශනයට පත්වෙනා කියන්නෙ ඔය දැකීමටයි. දැන් මේක එක පාර පේන්නෙ නෑ, ඒක නිසා තමයි සමථ කමටහනක් වැදගත් වෙන්නේ. සතලිස් කමටහන් වල ඔය ආනාපාන සතිය, ඔබ දන්නවනේ කුමන කමටහනක් හෝ සිත යම් එක අරමුණක තබා ගැනීම ඉතාම වැදගත්. සමථ කමටහනක සිත පිහිටුවා ගැනීම ඉතාම වැදගත්, මේක දකින්න පහසුවක් වෙනව. ඒ කියන්නෙ ඔබ හුස්මට හිත තියාගෙන ඉන්නවනම් හැම මොහොතකම ඔබ මොන කටයුත්ත කලත් ඔබගේ සිත හුස්මට එනවනම් ඔබ කාටවත් කිය කිය කරන්නෙ නැහැනෙ. ඔබ පුරුදු කරපු දේ එනව, දැන් ඔබ පුරුදු වෙලා තියෙනවනෙ අනුසෝතය තුල රැවටෙන්න එන එන එකට. දැන් නොරැවටී ඉන්න පුරුදු වෙන්නයි හදන්නෙ. නොරැවටී ඉන්න පුරුදු වෙන එක අමාරුයි. රැවටී ඉන්න එකට වඩා. ඒක පටිසෝතය ලේසි නෑ. අනුසෝතය ලේසි වුනාට, දැන් ඔබ ඒ අමාරුදේ කරන්න තමා වීර්‍යයක් ගන්නේ, මේකට ඡන්දය තියන්නෙ ඕන. කැමැත්ත තියෙන්න ඕන, වෑයම තියෙන්න ඕන, වීර්‍ය තියෙන්න ඕන,''ඡන්දං ජනේති ආරභති චිත්තං පග්ගංහොති පජහති'' කීවෙ ඒකයි. දැන් අපි කථා කරන්නෙ නූපන් කුසල් ඉපදවීම, උපන් කුසල් වැඩි දියුණු කිරීම, නූපන් අකුසල් නූපදවීම ''උප්පානං පාපකානං අකුසලානං ධම්මානං පහානං''. එතකොට මේ සිත පාප අකුසල් සිතිවිලි වලට රැවටිලා යන එක ''නුප්පානාං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙන්ති වායමති විරියං ආරභති චිත්තං පග්ගංභාති'' පජහති සතර සම්‍යක්

ප්‍රධාන වීර්ය තියෙන්න ඕන දැන් අපි කථාකරන්නේ නුපන් කුසල් ඉපදවීම උපන් කුසල් වැඩිදියුණු කිරීම ''උප්පානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය. එතකොට මේ සිතට මේ පාප අකුසල සිතුවිලි වලට රැවටිලා යන එක ''අනුප්පානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනේති වායමති විරියං ආරභති චිත්තං පග්ගංහාති පජහති'' ඉතිං මේ සතර සම්‍යක් ප්‍රධාන වීර්යට කුසලය පිහිටනව කියන්නෙ මේ සිත පේන්න ගන්නව. අකුසලය ප්‍රහීන කරනව කියන්නෙ සිත අර රැවටෙන ඒක නැතිකර ගන්නව. ඒ කියන්නෙ මුලින් රැවටෙනවනෙ. පස්සෙනේ පේන්න ගන්නෙ අන්න ඒක මුලින් සිද්ධ වෙන්නෙ ඒකයි ''උප්පානං අකුසලානං ධම්මානං පහානාය'' කියන්නෙ. ඒ කියන්නෙ ඒක පස්සෙ හරි දැකල එය ප්‍රහානය කර ගන්නව එවලෙම එවලෙම දකින්න ගන්නවට වඩා කලින් මේ මග හරහා ඒවත් එනව පුහුණුවෙන කෙනාට. ඔබ දැන් දන්නව අවබෝධයක් තියෙනව ඔබට අත්දැකීමක් තියෙනව ඔබ දන්නව එතකොට දැන් මේ සිතිවිලි එනව, මට දැන් බලන්න බැරිවුනා මෙන්න මට දැන් මතක් වුනා. මං දැන් රැවටිලා කියල ඔබට දැන් මතක් වුනානෙ අර සිහිය එළඹියානෙ ඒ මොහොතේ ඒක ප්‍රහානය කරන්න. ඒකයි ''උප්පානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය'' කීවේ ''ඡන්දං ජනෙති වායමති වීරියං'' ඔබ කැමති කෙනා අනිත් කෙනා මේක කරන්නෙ නැනෙ ධර්මය දන්නකෙනා වෙන්න ඕන, ඒකට කැමති කෙනා වෙන්නත් ඕන ''ඡන්දං ජනෙති'' ඔබ ඒක ප්‍රහීන කරනව ඔබ ඒකට කැමති නැහැ බොරුවට මායාවට රැවටෙන්න කැමති නැහැ. ධර්මය දන්න කෙනා ඒකට කැමති නැහැ ඒකයි මේක සම්බෝධි පරායන වෙනව කියන්නෙ. දැන් බෝධි කියන්නෙ

මොකක් ද? බුද්ධ කියන්නේ මේ දර්ශණ පථය දකින එක දර්ශන පථය දැකල ලෝභ ද්වේශ මෝහ නැතිවෙලා ඉන්නෙ ඒ සමාධිමත් ස්වභාවය බුද්ධ කියන්නෙ. ඒක ඇතුලෙ තව කථාවක් තියෙනව අපි ඒක පස්සෙ කතා කරමු. එතකොට බෝධි කියන්නෙ එතනටම තමා බුද්ධ, බෝධි එකම ස්වභාවයකින් නේ යන්නෙ. දැන් බෝධි අංග වැඩෙනව කියන්නෙ ''එම්ටිනස්'' එක දකින එකමයි උත්තරීතර හුදකලාව හද්දෙකරත්නෝ කියන එක, එතනට තමා මේ යන්නෙ මේ ඔක්කොම යන්නෙ ප්‍රභාෂ්වර සිතට තව පැත්තකින් කියනවනම් ඒ කියන්නෙ පුංචි දරුව ඉපදෙන කොට කෙලේසය වුනානෙ කෙලේසය නොවුන තැනට යන්නෙ, කෙලෙස් ප්‍රහීණ කරන්න යන්නෙ, එකයි ක්ෂිණාශ්‍රව රහතන් වහන්සේ නමක් කීවේ. එතකොට ඔබට මුලින් කරන්න දෙයක් නෑ නෙමෙයි, මුලින් තියෙනව හැබැයි අවසානයෙ තියෙනව ඔබට අවස්ථාවක් ඔබට අපි පෙන්වන්නම් ඒ කියන්නෙ මූලික අවස්ථාවේදී එකපාරටම මේ එන එන සිත දිහා බලන් හිටිය කියල, ඒක නෙමේ මූලික අවස්ථාව දැන් දන්නව ධර්මයේ එක අවස්ථාවකදී, ඔබට ඒ අවස්ථාව පැහැදිලි කරමු. මෙතන දී බාහිරය ඇත්තක් නොවන තැනදී, මේක සෝවාන් අවස්ථාව පුහුණු වෙන්න ඕන, දැන් මේ පේනව නෙමේ හිතනව කියල කථා කරන්නෙ සෝවාන් වෙන තැන. නමුත් හිතන තරම් දෙයක් නැ කියලා කියන්නෙ අනාගාමි වෙන තැන, ඔය ප්‍රතිපදා දෙකක් ඔය එකම ප්‍රතිපදාවෙ අදියර දෙකක්, එතකොට පේනව නෙමෙයි හිතනව කියන්නෙ සෝවාන් වෙන ප්‍රතිපදාව එතන පුහුණු වෙන අය එතන පුහුණු වෙන්නම ඕන. එක කරන්නම ඕන, සිතිවිලි කියල දකින්නම ඕන. හැබැයි ඊට පස්සෙ ඒ කෙනාට දැන් මේ ඔක්කොම පේන්න ගන්නව



www.buddothpado.com

සිතිවිලි කියල, චිත්ත ලෝකයක් පේන්න ගන්නව අර වර්ණ ටික පේන්න ගන්නව චිත්‍රයෙ ඇදපු, එහෙම නැතිනම් අර සිනමා ශාලාවේ පසුබිම, දර්ශන පථයෙ වැටෙන වර්ණ ටික පේන්න ගන්නව, සත්‍ය එක නෙමෙයි කියල. රැවටෙන්නෙ නෑ. එතකොට පේනව නෙමේ හිතෙනව කියන තැනයි ඒක තියෙන්නෙ. සිතිවිලි කියල දකින එක මේ ලෝකෙම සිතිවිලි, එතකොට එයා එන එන හැම අත්දැකීම් තියනවනෙ කොරෝනා කියල නම් දානව, කොවිඩ් කියල නම් දානව, ඇල්ෆා, බීටා කියල ඒක එක නම් වෙනස් කර කර යනකොට තේරෙනව මේක නෙමේ ඇත්ත කියල. මේ අපි දාගත්ත ඒව වෙනස් කරන්නෙ කියල, එතකොට අපි කියනව මේක වාහනයක් එක විදිහකට හදපුහම කාර් එකක් තව විදිහකට හදපුවහම ජීප් එකක් මේ එක එක විදිහට වෙනස් කරන්නේ අපි. හැඩතල වලට නම් දාන්නෙ අපි. මේකෙ නව කථාවක් පේනව නේද? එකියන්නේ මේ ක්‍රියාවලියක් තියෙන්නෙ ඒ ක්‍රියාවලියට අපි එක එක නම් දෙනව.

දැන් පුංචි දරුව දැඟලුවේ නැද්ද? හුස්ම ගත්තෙ නැද්ද? පුංචි දරුව කෑවෙ නැද්ද? ඒ වුනාට පුංචි දරුව දැනගෙන හිටියෙ නෑ මොකුත්. නමුත් එතන පුංචි දරුවට ක්‍රියාවලියක් තිබුණා. අද ඔබ හුස්ම ගන්න එකයි පුංචි දරුව ප්‍රභාස්වර සිත හුස්ම ගන්න එකයි දෙකම එකයිනෙ. ක්‍රියාවලියක් තියෙනව. දැන් ඇවිදිනව කියන එක නාමය ඔබ දකිනව එහෙම දෙයක් නැති බව. අපි හදාගත්ත නමක් සිංහලෙන්නෙ ඇවිදිනව කියන්නෙ ඉංග්‍රීසියෙන් කියන්නෙ ''වෝකින්'' නෙ ඔන්න ඔය වගේ ශබ්ද, ශබ්ද නෙමේ මෙතන තියෙන්නේ ක්‍රියාවක් අපි ශබ්දය අයින් කරල ක්‍රියාව දකිනව කියන්නෙ, සම්මුතියෙ හදාගත්ත ඒව මකනව මැකෙනව මේ මාර්ගයේ

යන කෙනාට මැකෙනව, ඒ කියන්නෙ ඔබට එවෙලට එවෙලට එන සිත මුලින් මුලින් ඔබ ටික ටික තමා මේක දකින්නෙ එක පාරටම ගොඩක් මේක දකින්න බෑ. නමුත් ඔබට මුලින් මුලින් උත්සාහ කරන නිසා ඒක සිද්ධ වෙනව. ඉතිං මේ හැම එකම පේන්න ගන්නව එහෙම දෙයක් නෑ නේද? මේව අපි හිතින් හදාගත්ත ඒව ධර්මය දන්න කෙනාට බොරු කරන්න බෑ. ඒකයි මේ ඇත්තටම සෝවාන් වෙන්නෙ දර්ශන සමාපත්තියෙන් කියන්නේ ඒකයි. ඒ කියන්නෙ එයාට පේන්න ගන්නව බාහිරය ඇත්ත නෙමෙයි කියල. දර්ශන අවබෝධයෙන් ඒක එනව මොකුත් භාවනා කරල නෙමේ එයා භාවනා නොකර ඒක එනව ඒක තුල සෝවාන් වෙනව. ඒ කියන්නෙ එයා ඊට පස්සෙ මැරෙන කොටත් මේ ලෝකේ බොරුවක් කියල දකිනව. නමුත් එයාට ප්‍රත්‍යක්ෂ වෙලා නැතිවෙන්න පුළුවන් ඒක තමා එයා නැවත උපදින්නෙ. නමුත් එයා දකිනව, ඒක දකින්න ලේසි නෑ, ඒ කියන්නෙ ඒ තැනට එන්නත් ලේසි නෑ, මේ දෘෂ්ඨි කාන්තාරයකනෙ අපි ඉන්නෙ. ඔක්කොම තියෙනව කියල අරගෙන, තියෙන්නේ බොරුවක්නෙ. අරව තියෙනව, මේව තියෙනව, බොරුවක් වෙනවනේ. ඇත්තටම මෙතන අපට කකුල් දෙක දෙපැත්තෙ තියාගන්න බෑ ලෞකික පැත්තෙ එක කකුලයි, ලෝකෝත්තර පැත්තෙ එක කකුලයි, තියාගන්න බෑනෙ. අපිට කෙලින්ම ලෞකික පැත්තට පයින් ගහල ලෝකොත්තර පැත්තට එන්න වෙනවනෙ. එතකොට දිව්‍ය ලෝක අපාය සියල්ල බොරුවක් කියල මේ සිත විතරයිනේ මේ එක්ක්ෂණික සිත විතරයිනේ දකින්නේ. එතෙන්ට එන්න වෙනවනෙ. එතකොට කකුල් දෙක දෙපැත්තෙ තියාගෙන යන්න බෑනෙ ගමන් මඟක් නෑනෙ, එතකොට ඒ කෙනාට බණ අහන්න සිද්ධ වෙනව බණ

කියන්නත් සිද්ධ වෙනව. බණ අහන අයටත් බණ කියන්න සිද්ධ වෙනව, මෙහෙම දෙයක් නෑ මේ සිත විතරයි තියෙන්නෙ, සිත දකින්න කියල. එතකොට එයා සිත දකින කොට එයා ලෝකෝත්තර භූමියට, ආර්ය භූමියට පත්වෙනවා. මේ යුගයේ ලෝකෝත්තර ධර්මය දේශනාවෙනවා. ඒක නිසා තමයි ගැටෙන්නේ ගොඩක් වෙලාවට ලෞකිකයෙ හිරවෙලා ඉන්න අය. ඒ අය දොස් කිය කියා දඟලන්නෙ නමුත් ඒ දොස් කියන්න දෙයක් නෙමෙයි, එකට හේතුවෙලා තියෙන්නේ මේ ලෞකිකයයි ලෝකෝත්තරයයි අතර ගැටීම. අදහස් දෙක, මේ ලෞකිකය ඇත්තටම කුඩුවෙලා යනව ටික ටික ලෝකෝත්තරය වැඩිවෙනව ඒ සන්ධිස්ථානය තමයි මේ මොහොත. මේ ධර්මය ඉස්මතු වෙන වෙලාව අද මේ යුගය වෙනකොට එකවෙලා. අපිටත් මේක අහුවෙලානේ, නැත්නම් අපිත් මේක දැන ගන්නේ නැතිව ඉන්න එපැ. මේක කොහොම හරි අපිත් දැනගත්ත නිසානෙ  අපිට කථා කරන්නෙ, කථා කරන කොට අපිට එක පැත්තකට යන්න වෙනවනෙ මේ කකුල් දෙක දෙපැත්තෙ තියාගෙන බෑනෙ, මේක බොරුවක්නෙ මේ බොරුව, බොරුවයි කියල දකින්නැතිව බෑනෙ. මේ සිත, එක්ක්ෂණික සිතයි නම් තියෙන්නෙ ඒ සිත හටගෙන නිරුද්ධ වෙනෙවනම්, ඒ වෙන දෙයක් පනවන්න බැරිනම් ඒ සිතත් ඇත්තක් නෙමෙයි නම්, මේ අපි සිතන එවා විශ්දේශ්‍රානනේ, ඔක්කෝම සංඛාරනේ බොරුනෙ, හොඳට බලන්නකො මේ මොකක්ද වෙන්නෙ කියල. මේ ලෝකෙම බොරුවක් වෙලානේ 'විනෙය්‍ය ලෝකේ අවිද්‍යා දෝමනස්සානං කියලා බුදුරජාණන් වහන්සේ සෑහෙන සූත්‍ර දේශනාවල, අපි මේ සූත්‍රම අරගෙන පෙන්වන්නෙ. ඒ නිසානෙ බුදුරජාණන් වහන්සේ ඇත්තටම අර

සාමාන්‍ය සම්මුතියේ මිනිස්සු කථා කරන විදිහට කියනවනම් උගුර ලේ රහ වෙනකම් කියල තියෙනව මේ ලොකේ බොරුවක් කියල. 'රූපෙ අනිත්‍යතෝ' කියන්නෙ ලෝකෙ බොරුවක් කියන එකමයි. ඒකම තමයි තියන්නෙ 'විනෙය්‍යය ලෝකෙ අභිද්ධ්‍යා දෝමනස්සං කායෙ කායානුපස්සයි විහරති' සතර සති පට්ඨානයන් වඩන්න බෑ ලෝකේ ඇත්ත කරගෙන. ලෝකෙ බොරුවක් කියන කොටම මොනවද වෙලා තියෙන්නෙ, කොහෙද ලෝකයක් තියෙන්නෙ, දැන් මේ ඉන්න ලෝකෙත් බොරුවක් වෙලා කොහෙද තව ලෝකයක් තියෙන්නෙ, දිව්‍ය ලෝකය, අපාය ලෝක ඔක්කොම බොරු වෙනව ඔක්කොම සිත තුළින් දකින්න වෙනව, සිත තුළින් පනවන්න වෙනව, සිතතුලින් මිදෙනව, ඔක්කොම සඤ්ඤා තමයි ඒකමයි සංඛාර වෙනව කියන්නෙ, එකම කතාවක් මේ කියන්නෙ දැන් මේක ප්‍රායෝගික පැත්තෙදි ඔබ දැන් මේ සිත දකින්න. ඔබට සමථය අවශ්‍යයි. දැන් ඔබ ඇවිදින කොට, හුස්ම දිහා දකින කොට, ඔබට එක එක ඒවා මතක් වෙන විට, ඔබ හුස්මට එනව දැන් අපි සාමාන්‍යයෙන් අපි පුහුණු වුන ආකාරය ඔබට කියන්නෙ. දැන් හිත විසිරෙන කොට අපි හුස්මට තමයි එන්නෙ, හුස්ම තමා අපේ ගෙදර. ඒ කියන්නෙ සතිය තමා අපේ ගෙදර. සතිය කියන්නෙ මොකුත් නැති 'එම්ටිනස්' එක. ඒක තමා අපේ ගෙදර ඒ කියන්නෙ අපි දැන් මොනව හරි දෙයක් කරන කොට, ඇවිදිනකොට, වැඩ කරන කොට, ඕනම වෙලාවක ඕනම ඉරියව්වක ඔබේ සිත දුවනවනම්, සිතිවිලි එනවනම්, සිතිවිලි කියන්නෙ අකුසල් නෙ, ඒකට කැමති නෑනෙ ටක් ගාල සමථයට එනව. ඒ කියන්නෙ සති නිමිත්ත අල්ලනව, ඒක්කෝ හුස්මට එනව, එක්කෝ ඉරියව්වට එනව, මම මෙතන වාඩි වෙලා ඉන්න ඉරියව්වට



www.buddothpado.com

එනව. එහෙම නැතිනම් එනව සති කමටහනට, හුස්මට එනවා. එතකොට මෙතන තමන්ගෙ ගෙදරට එනව කියන එක තමයි අපි කියන්නෙ. ගෙදර එනව කියන්නෙ. අපි දැන් කොහෙ හරි ගියොත් එහෙම ගෙදරට ආවයි කියන්නෙ, එතනින් ගමන ඉවරයි කියන එකනෙ. ඒ ගෙදර තමයි අපේ සතිය, සතිය කියන්නෙ 'එම්ටිනස්' එකට තමා. ශුන්‍යතාවයම තමා. ඒ සතිය තුල මොකුත් නෑ, අපිට එහෙම තමා කියන්න වෙන්නෙ. මේ සතියට එනව කියන්නෙ සිතිවිලි නෑ, මොකුත් නෑ තියෙන්නෙ සිතුවිලි නෑ. දැන් අපි සිතිවිලි වලින්නෙ මිදෙන්න යන්නෙ, සිතුවිලි වල තියෙන ලෝභ ද්වේශ මෝහ සිත්නෙ අපිට අකුසල් ගේන්නෙ. ඒ සිත් එන එක අපිට අකුසලයක්නේ, එහෙමනම් අපි ඒක ප්‍රහානය කරන්න ඕනේ, කුසලයනෙ උපසම්පදා වෙන්න ඕන. එහෙනම් කුසලයනෙ අපි දැන් වඩන්න ඕන. 'සචිත්ත පරියෝ දපනං' වෙන්න ඕනනෙ, එහෙනම් මේ හැම සිතක්ම, සිතුවිලි එනකොටම අපි දන්නව එක අකුසලයක් කියල, සිතිවිලි පස්සෙ හඹාගෙන යනවනෙ පැටව් ගගහ ගගහ. අතීතයේ වෙච්ච ඒව අනාගතයේ හිත හිත යනවට වැඩිය හොඳ නැද්ද ඒ දෙකෙන්ම අයින් වෙලා, මේ ඔළුව ගිනි අරගෙන ඊට පස්සෙ ඉන්නෙ මොනව හරි දෙයක් හිත හිත ඉන්න කොට ඔළුව ගිනි අරගෙනනෙ. ඇත්තටම ඉන්නෙ ද්වේශයෙන්, වෛරයෙන්, එක්කෝ ඊර්ෂ්‍යාවෙන් එක්කෝ රාගයෙන් ඔය හැම තිස්සෙම රාගයෙන් ද්වේශයෙන් මාරුවෙචි යනව දෙපැත්තට. මේ සිත ඔරලෝසුවේ බට්ට වගේ දෙපැත්තට යනව. රාගයයි ද්වේශයයි එක්කෝ අර පැත්තෙ එක්කෝ මේ පැත්තෙ. එක්කෝ අර පැත්තේ එක්කෝ මේ පැත්තේ. සිතිවිලි එනව ඒ පැත්තට නැත්නම් මේ පැත්තට ඒ දෙක නැතිව ඔර්ලෝසුවේ

බට්ට නවතිනව වගේ එක පාරටම එනව සමථයට, ඉතිං එතෙන්ට එන එක තමා සතියට එනව කියන්නෙ. එක තමා සති කමටහනෙ තියෙන බේස් එක. කවුරු හරි වෙන විදිහකට විග්‍රහ කළත් ඇත්තටම ඒ අය ඕතනට තමා එන්නේ. ඒ අයත් නිවන් දකින්න එපායැ, ඔතෙන්ට තමා එන්නෙ අවසානයෙ. ඒ කියන්නෙ සති කමටහන තියාගන්න ඒක බේස් එක. හැබැයි සති කමටහනේ අපි සිත තියාගෙන ඉන්නෙ සිත විසිරෙන කොටයි, එන එන සිතේ සත්‍ය දකිනව. මේ මූලික කමටහන තමයි පැහැදිලි කරන්නෙ. අවසාන අවස්ථාව නෙමෙයි. මොකද මේ නිවන් මග කියන්නෙ පොඩි කථාවක් නෙමේ. මේක කෙන කෙනාගෙ හැටියට වෙනස් වෙන්නත් ඕන, සමහර අය සමථ විපස්සනා යුගන්ධන් විධිහට තමයි මේ කථාව තියන්නෙ. නමුත් සමහර අයට උපතින්ම සමථය තියෙනව, සමහර අයට එහෙම නැහැ සිත විසිරෙනව, සමහර අයට විපස්සනාව උපතින්ම වැඩියි. ඒ කියන්නෙ විදසුන් නුවණ තියෙනව, එ අයට සමථයට වැඩිය විදසුන් නුවණ ප්‍රඥද්ඥාව උපදිනව. ඒ අයට සමථය ඕනැ මොකද හැම දෙයකින්ම මේ දෙක සමබර කර ගන්න ඕන. දෙකම සමබර කරගත්තොත් තමයි නිවන් මගක් ලැබෙන්නෙ. නැතිනම් කොහෙන් හරි සිත විසිරිලා ඇල්ලෙනවා, විදර්ශනා වැඩියි කීවට ඒ පැත්තෙනුත් අහුවෙනව. එහෙම වුන ගමන් අන්තයකට යනව. අන්තයකට ගිය ගමන් මජ්ඣෙධ ඥාණං කියන තැනට එන්නෙ නෑ. මේ මජ්ඣෙධ ඥාණං කියන තැන ඉතාම වැදගත්. මේ සිත මිදෙනව මේ සිත මුදවන්න බෑ ඔය අන්තයට ගියාට කොයි පැත්තෙන් ගියත්, දැන් විදර්ශනා නුවණ කියන්නෙත්, දැණුම කියන්නෙත් අන්තයක් මනේ දැණුම වැඩියි කියන්නෙ ඔක්කොම මතක් වෙනවනේ, ඒ කියන්නේ ඒවම මතක් වෙවී

ඉන්න කොටත් මිදීමක් නෑනෙ, ගිණි අරගෙන නෙ, ගින්න නිවීමනෙ නිවන කියන්නෙ, ගිණි ගත්ත සිතක නිවනක් නෑනෙ, උගත් කමත් ගින්නක්නෙ, මෝඩකමත් ගින්නක්නෙ, දැන් මේක සමහර අයට තේරෙන්නේ නෑ මේ මජ්ඣෙධ ඥාණං, සමථ - විපස්සනා කියන දෙක සමබර වෙන්න ඕන කියන එක සමහර අයට තේරෙන්නෙ නෑ. මේ දෙක බැලන්ස් වෙන්න ඕන, මේ මාර්ගය තුල මේ දෙක සමබර වෙන්න ඕන. දැන් ඔබට අපි එක් මූලික අවස්ථාවක් ඉදිරිපත් කලා. සතිය අවශ්‍යයි කියන එක, එවගේම සතිය හදාගන්න ක්‍රම ගොඩක් තියෙනව. ඇත්තටම අපිනම් මුල් යුගයේ දී නීල කසිනය එහෙම හදාගත්ත. අපි ඒ ධර්මය ගැන මොකුත් අවබෝධයක් නැතිව සමථයම  වඩපු කාලෙ. අපි ඔය අගල් දොළහක රාමුවක් හදාගෙන නිල්පාට මැද්දෙ තිතක් තියාගෙන 'නීල කසිනය' ඔය වගේ සමථය වඩන්න අපි ගොඩක් මහන්සි වෙලා තියෙනව. සුළඟ ඇගේ වදින එක 'පඨවි' ධාතුව ඒ විදියටත් අපි හුඟක් පුහුණු වෙලත් තියෙනවා මහන්සි වෙලා තියෙනව. ඒ වගේම ආනාපාන සතියත් සෑහෙන කාලයක් තිස්සේ වඩල තියෙනව. ඒක නිසා අපට හැම මොහොතෙම හුස්මට ගන්න ලේසියි එනව නිතරම. ඒ වගේම ඉරියව්වටත් හිත ගන්න ලේසියි, ඒ කියන්නෙ හිත විසිරෙනවනම් එක තැනකට ගන්න ලේසියි. එවෙලෙම සිහිය උපදිනව. සිහිය නැතිව මේ ගමන යන්න බෑ. සිහියයි නුවණයි නෙ මේ ගමන යන්නෙ. සිහිය උපදින්නත් මේ සමථය අවශ්‍ය වෙනව. ඉතිං මේක ගොඩක් විදිහට අපට පේනව, බුදු රූපෙකටත් හිත තියා ගෙන බුද්ධානුස්සතිය වඩන විදියට සිත තියාගන්න පුළුවන් ඒ වගේම අට්ඨික භාවනාව  කරනකොට අර ඇට සැකිල්ලකට සිත තියාගෙන, ඔය ගොඩක් ආරන්‍යවල තියෙනව, ඒක

ගොඩක් හොඳයි. රාගය වැඩි අයට මොකද මනුෂ්‍ය ශරීරයට ඇල්ම වැඩි අයට ඒකෙන් මිදෙන්න එක ඇටසැකිල්ලක් හැටියට දකින එක හොඳයි. නමුත් ඒකත් අර අනවශ්‍ය විදිහට නැතිව අසුභය පැත්තට ඕනවට වැඩිය ගියොත්, ද්වේශය. කොයි පැත්තට ගියත්, ඇලෙන්න ගැටෙන්න ගැට ගැහෙනව මේසිත. හැම තිස්සෙම තමන්ටම නුවණක් තියෙන්න ඕන අන්තෙටම යනවනම් ඉක්මනට ලිහෙන්න අන්තෙකට යනවනම්, ඒ කියන්නෙ මේ සමථ කමටහනත් අන්තයකට යන්න පුළුවන්, අපි අල්ලගෙන ඉන්නෙ සමථ කමටහනනෙ. අපි හිතමු බුද්ධ රූපය කියල, එකම ඔලුවේ වැදිලා තදට වැඩිල හිතට එකෙන්ම ගැලවෙන්න බැරිව ඉන්නවනම් එතනත් තියෙන්නෙ අන්තයක්, එතකොට 'මජ්ඣෙධ ඥොණං' කියන තැනට යන්න බෑ. නිවන තියෙන්නෙ මජ්ඣෙධ ඥොණං කියන තැනනෙ. එතකොට සිතිවිලි එක අන්තයකට හිරවෙච්ච ගමන් උපාදාන වෙනවා, උපාදාන වෙච්ච ගමන් එතන තියෙනවනෙ ඒකම නැතිව ඉන්න බැරිකමක්, එතනදී දෙයක් අල්ලගෙනනෙ, එහෙම වෙන්න බෑ, සිතිවිලිනෙ එතකොට තියෙන්නෙ, එතකොට හොඳට බලන්න මේ සිතිවිලිද කියල, එතකොට හොඳ සිහියක් නුවණක් ඕන. මේ සිතිවිලි නෙමේ නම් ගැටලුවක් නෑ. දැන් සිතිවිලි නම් එතන තියෙන්නේ ඇත්තටම කර්ම රැස්වෙන එකක්, ඇත්තටම කියනවනම් සිතිවිලි තමයි භයානක, ඒ සිතිවිලි අපට දෙනව පැටව් ගහ ගහ අභිසංස්කරණයක් දෙනව 'ප්‍රපඤ්ඤද' හැදෙනව. එතකොට 'මඤ්ඤදනාවට' යනව ගැලවීමක් නෑ, අපට ගැලවිමක් තියෙන්නෙ, සැහැල්ලුවක්, 'එම්ටිනස්' එක තියෙන්නෙ, සිතිවිලි වලින් මිදුනොත් විතරයි. සිතුවිලි එනව යනව ඒවයෙ ඇලෙන ගැටෙන තණ්හා මාණ දිට්ඨි තමා මේ



www.buddothpado.com

මිදෙන්නෙ, ඒකියන්නේ ලෝභ, ද්වේශ, මෝහ කෙලෙස් අපි මේ වචන වලින් ඉදිරිපත් කරන්නෙ, වෙනදේ අපිට තේරෙනවා, අපිට තේරෙනවා වෙන්න ඕන මොකද්ද කියල. අපට තේරෙනවා මේකට ඇලෙන ගැටෙන ගින්න මේ සිතිවිලි වලම තියනව. මේකට ඇලෙන ගැටෙන, ඒ කියන්නේ එන අරමුණු වලට ඇලීමක් ගැටීමක් තියෙනව. අන්න ඒක දියවෙල යනව. අන්න ඒකයි විරාගයට යනව කියන්නෙ. නිබ්භිනන්ති, විරාගන්ති, මේ එක්ක්ෂණික සිතම දකින්න ඕන, ඒක තමා 'තත්‍ර තත්‍ර විපස්සති' කියන්නෙ. සිත් පරාම්පරාවක්නෙ එක සිතක් කියල අපි කථා කලාට සිතිවිලි පරම්පරාවක් තමා අපට පේන්නෙ. ඒ සිත් එතන එතන එකින් එක නිදහස් වෙවි යන එකක් තමයි තියෙන්නෙ. එක දකින්න මහා නුවනක් ඕන එකපාරටම පේන්නෙ නෑ, මුලින් අර දකින්න ඕන ස්වභාව ටිකක් වැදගත්. ඒ කියන්නෙ හැම මොහොතකම තමන් සිතිවිලි දකින්න ඕන, සිතිවිලි තමයි අකුසල් කියන එක දකින්න ඕන, එතකොට කුසලයෙ පිහිටනව කියන්නෙ, සිතිවිලි වලින් මිදිල ඉන්න ඕන. මේ විදිහට දකිනව, එතකොට සමථයට එනව හැම මොහොතකම, දැන් සමථ කමටහනක් හදාගන්න ඕන. එයාගෙ විදිහටම සති කමටහන හදාගන්න ඕන. ඒක තමයි ගෙදර වෙන්නෙ, එතන ඉදන් එයා ජීවත් වෙන්නෙ හැම තිස්සෙම සතියත් එක්ක. සතිය වඩනව කියන්නෙ, ආධ්‍යාත්මික දියුණුව කියන්නෙ, සතියම තමයි. ඒත් එක්කම තමයි ආධ්‍යාත්මික දියුණුව තියෙන්නෙ, ඒත් එක්කම විදසුන් නුවණ අර එන එන සිත දකින්න, ඒ සිතත් වැඩෙනව අර සිහියයි පිහිටන කොට සිහියයි, නුවණයි වැඩිවෙන කොට. සිත විසිරෙන්නෙ නැති වෙන කොට අරමුණු පේනව. අරමුණ

හොඳට පේන එක විදසුන් නුවණට ඕන. මේකට හේතුව තමයි දැන් මේ මොහොතෙම ආපු සිත ටක් ගාලා පෙනෙනව නම් ඒ සිත බාහිරයේ නෙමෙයි. සම්මුතියේ නෙනෙමයි කියල සත්‍ය ඤාණය ගන්නව ටක් ගාලා. සත්‍ය ඥාණය ගත්ත ගමන්ම බාහිරයත් එක්ක ගැටෙන්නෙ නෑ, කවුරු හරි බණින කොටත් ඒ මට  නොවේ නේ, මගේ හිතෙනේ, බැණුම් තියෙන්නෙ, ඒ ධර්මය එනව ටක් ගාලා එතකොට. මෙයා හොඳ කෙනෙක් නෙමේ, නරක කෙනෙක් කියන එකත්  මගේ හිතමනෙ කියන්නෙ කියල එනව. නමුත් ඒ එන වේගය වැඩිවෙන්නෙ විදසුන් නුවණ වැඩිවීම තමයි. ඒ එන වේගය වැඩි වෙන්නෙ, ඒ කියන්නෙ විදගෙන යන නුවණ, බාහිරයෙන් කෙනෙක් එන කොටම කෙනෙකු පේන්නේ නෑ එයාට තමන්ගෙ හිතයි පේන්නේ එක විදසුන් නුවණ, යථාභූත ඥානය යෝනිසෝමනසිකාරය, එතන එතන යෝනිසෝ සිහියයි නුවණයි පිහිටන එක තමා යෝනිසෝ මනසිකාරය, හැබැයි යථා භූත ඥාණය කියල කියන්නෙ එකෙ යථාර්ථය දකින එක. එන අරමුණක් එක්ක ලොකු ෆයිට් එකක් යනව, ඒකයි මේ යුද්ධය තියෙන්නෙ තමන්ගේම සිතත් එක්ක තමයි. තමන්ගේ සිත එක්ක ඇතිවන නැතිවන මේ සිතේ සත්‍ය දැකල මිදෙන යුද්ධයක් මේ සිතේ තියෙන්නේ . ඒකට තමා මාරසෙන් දමනය කියල කියන්නේ, ආත්ම තණ්හාව තමා මාරය, ඒකයි මෝඝරාජ සුත්‍රයේ මෝඝරාජාට පෙන්වනවනේ 'අත්තානුදිට්ඨිං උගහච්ච' ආත්මය අනුව ගිය දෘෂ්ඨිය අත්හරින්න කියල 'මච්චුරාජා නපස්සති' කියල , ඒ කියන්නෙ ඊට පස්සෙ මාරයා ඔබ සමග  එන්නෑ කියල, මාර්ගයෙන් මිදෙන එකම ක්‍රමය එකයි කියනවනේ, ඉතිං ඒ බුදුරජාණන් වහන්සේ පෙන්වන මේ කාරණාව ඉතාම වැදගත්. ඒකම තමා



www.buddothpado.com

මේකෙන් සිද්ධ වෙන්නේ, ඒ කියන්නෙ මේ සිත එන යන අරමුණු මේකම තමා යුද්ධය. එක යුද්ධයක් කෙලෙස් යුද්ධයක්, ඒ කෙලෙස් මාරයාම තමයි ආත්මය කියන්නෙ, මේ දෘෂ්ඨිය, මේකේ සිතින් පිට කතාවක් නෑ. බුදුරජාණන් වහන්සේ ගයා ශීර්ෂයේ බෝධි මූලයේ බුද්ධත්වය ලැබුවේ හුදකලාවේ කොහෙවත් ගිහිල්ලා යුද්ධ කරල නෙමෙයිනේ. සිත ඇතුලෙ යුද්ධය අළුයම, තුන්යම මැදියම මේ කරපු යුද්ධය. එකෙන් තමා බුද්ධත්වය ලැබුවේ. ඒ බුද්ධත්වය තමා අපිත් ලබන්නේ මේ. නමුත් අප සම්මා සම්බුද්ධ වෙන්නේ නෑ. එක ලෝකෙටම මුලින් හෙලි කරපු ඒ ශාස්තෘන් වහන්සේගේ අපි ඒ පාරෙ යන නිසා අපි ශ්‍රාවකයෝ එතනයි වෙනස තියෙන්නේ, නමුත් එකම බුද්ධ ස්වභාවයක් තමා, අපිට මේ ප්‍රිකුවන්ස් වෙනව, නැතිනම් 'ටියුන්' කරනව වගේ. දෙයක් අපේ මනස 'ටියුන්' වෙනව. අපේ මනස 'ටියුන්' වෙනව ශුන්‍යතාවයට. අපේ මනස ශුන්‍යතා අනිමිත්ත චේතෝ විමුක්තියට ටියුන්වෙනව. හැබැයි මේ ප්‍රතිපදාව අපි එදිනෙදා වැඩ කරන කොට හැම මොහොතේ දීම අපි සති කමටහනේ ඉන්න ඕන, එත් එක්කම අපි එන අරමුණෝ සත්‍ය දැකල මිදිල සති කමටහනේ ඉන්න ඕන. අරමුණෝ සත්‍ය දැකල මිදිල සතිකමටහනේ ඉන්න ඕන. එහෙම තමයි අපිට කියන්න වෙන්නේ, එන එන අරමුණෝ සත්‍ය දැකල මිදෙනකොටම ශුන්‍යතාවයට වෙලා ඉන්නේ, හැම මොහොතකම ශුන්‍යතාවයට වෙලා ඉන්නේ. සමහර විට නෙනෙක් කියනව නෑ එහෙම හැම මොහොතෙම එයා අවබෝධඥාණයට පත්වුණාට පස්සේ එතනම තමා ඉන්නේ, එතන තමා එයාගේ ගෙදර. අර ප්‍රත්‍යක්ෂතාවයට පත්වෙලා නැතිව නිකං හිතල බණ කියන්න ගියහම තමා ඔය එක එක ඒවා කියවන්නේ.

එයාට ඒක ප්‍රත්‍යක්ෂ නැති නිසා නමුත් ඔබ මේක පුහුණු වෙන්න. ප්‍රායෝගික වෙන්න, ඔබේ සිතින් මිදිලා ඔබගේම සිතේ ඇත්තටම ඒ ආයතනවල, දැන් ඔය සිතිවිලිනේ ඔය රසවිඳින්නේ. සිතිවිලිනේ ඔය ලස්සනයි කියන්නේ, සිතවිලි තමයි මේ ශබ්දයට එක එක එවා දාලා තියෙන්නේ. ඔය හැඩ තල සේරම බිඳ වැටෙනව, බිඳ වැටිලා ඔබ  එතන එතන දැනෙන ස්භාවය පමණක්, සිතිවිලි වලින් මිදුණු ස්වභාවයක, මහා ශාන්ත සුවයක් ඔබට දැනෙන්න ගන්නව සිතිවිලි නැ, ඒ කියන්නේ සම්මුති ප්‍රඥප්ති කිසිවක් නැතිව ජිවත් වෙන්නේ. ජීවත් වෙනව කියල දේකුත් නැ. සම්මුති ප්‍රඥප්ති මොකුත් නැතිව අර ඒ එතන එතන සිද්ධිය පමණයි. කෙනා, පුද්ලයා, ඔක්කොම සම්මුතියත් එක්ක තියෙන්නෙ, එවා එක පාරටම එක ගොන්නට යන්නෙ සේරම ගැලවිලා එක දවසින් එක මොහොතින් වෙනව කියනවටත් වැඩිය කෙනා කෙනාගෙ ස්වභාවයට ඒක වෙනස් වෙනව, දියවෙලා යන එකක් තමා ගොඩක් වෙලාවට තියෙන්නෙ. ඒ කියන්නේ ක්‍ෂය වෙලා යනව ටිකෙන් ටික. මේ මාර්ගයේ යනකොට, මේ උත්සාහයෙ යෙදෙන කොට, එයාට මේ කාලයත් එක්ක යනකොට කලින්ට වැඩිය දැන් මම සේරගෙන්ම ඇලෙන්නෙ නෑ, ගැටෙන්නේ නෑ, එයාට දැනෙනව. එව තිබුණත් එකයි නැතත් එකයි. ඉස්සර නම් ඒව පස්සෙ දීව දැන් දුවන්නෙ නෑ ඔහොම ගොඩක් වෙනස් වෙවී යනවා එයා, අර ක්‍ෂයවී ගෙන යනව, ආශ්‍රව කෙලෙස් එක 'ආසවක්ඛ්‍යා ඥාණයටයි' දැනෙන්නෙ එයාට හිතනව නෙමේ එහෙම වෙනව  එක ඔබටත් වෙයි. ඒක මහා දියුණුවක් අටලෝ දහමෙන් කම්පා නොවන ලාබ, අලාභ, නින්දා, ප්‍රසංශා, කීර්ති අපකීර්ති, සැප, දුක් සැම දේම ස්වභාවයකින් දැනෙනව. කම්පනයක් නෑ අකම්පිතයි මෙන්න

මේ ස්වභාවයට තමයි යන්නෙ. හැබැයි මේකෙ අවසානයේදී ඔබ බලාගෙන ඉන්න එකක් තමා සිද්ධ වෙන්නෙ. ඒ කියන්නෙ මේක අර මුලින් විර්යයෙන් අරගෙන කලාට ශ්‍රද්ධා, වීරිය, සති සමාධි, ප්‍රඥා ඉන්ද්‍රිය ධර්ම බල ධර්ම බවට පත්වෙනව. ඒ කියන්නෙ ඒක ඉබේ 'ඔටෝ මැටිකලි' සිද්ධ වෙනව, දැන් ඔබ සිතනව නෙමේ ඉබේම සිතෙන් එනකොටම ඇත්ත දකිනව අන්න බල ධර්ම බවට පත් වෙනව, ඒ ඔබගේම අභ්‍යන්තරයේ ආධ්‍යාත්මික දියුණුවක් ලබනව. ඒක බෝජ්ඣංග වැඩනෙව කියන්නෙ ඒක කාටවත් නවන්න බෑ. මිරිස් පැලයක් වැඩෙනව වගේ ඔබගේ ඇතුලාන්තයෙන් 'බොජ්ඣංග' ධර්ම (බෝධි අංග) වැඩිල ඔබ සම්බෝධිත්වයට පත්වෙනව. සම්බෝධි පරායන වෙනව කියන්නෙ ඒකයි, ඒක නවතින්නේ නෑ මේ මාර්ගයට බැස්සට පස්සෙ එක දිගටම පටිසෝතයට තමයි යන්නෙ. මේකයි අපි කිව්වේ මේ මාර්ගයේ යන කෙනා දුගතියෙන් මිදෙනව. සුගතියට යනව. එ කියන්නේ දුගතියට වැටෙන්න හේතු නැතිවෙනව කියන්නෙ ඒකයි. මේ මාර්ගයට එන කෙනා. ඒකයි සුගති පරායන, ඒකායන මාර්ගය මේකයි කියල අපි කියන්නෙ. දැන් ගොඩක් අය කියනවනෙ පින් දහම් කරන්න, දන් දෙන්න, කියල ඒත් ඒ අය දුගතියට වැටෙනවනෙ, නමුත් මේකෙ දුගතියට වැටෙන්නේ නෑ. ඇත්තටම බුද්ධ දර්ශනයක් නැතිව ඔය කියන බණ එකක්වත් බෞද්ධයෝ කියන ඒව නෙවේ. ඒ අය මිත්‍යා දෘෂ්ඨිකයි (බෞද්ධ)බෞද්ධයෙක් නම් භවය කියල ගන්න ඒකෙන් මිදෙනව නම් තමා බෞද්ධ වෙන්නේ. මේ සත්‍ය දකින තැන මේ බෞද්ධ දර්ශනයක් දන්නේ නැතිව බෞද්ධයෙක් වෙන්නෙ නෑ. හැම බෞද්ධයෙක්ම මේ ලෝකය බොරුවක් කියන එක දකිනව

නම් ඒ බෞද්ධයෝ තමයි. ලෝකය ඇත්ත කරගෙන ඉන්නවනම් ඒ අය බෞද්ධයෝ නෙමෙයි. ඒක ඇත්තටම බෞද්ධ කියනකම වැටෙන්නෙ ඔතනින් ලෝකය ඇත්තක් නෙමේ කියන තැනට ගියාට පස්සෙ නිවිල යානවා. ඉතිං මේ ප්‍රතිපදාව තමන් එදිනෙදා හොඳට පුරුදු වෙන්න ඕන. ඇත්තටම මුලින් මුලින් සතර ඉරියව්වෙම පුහුණු වෙන්න ඕන, මුලින් මුලින් හොඳට වීර්යය තියෙන්න ඕන. මුලින් වීර්යයෙන් තමා මේක සිද්ධ වෙන්නේ ආරද්ධ වීර්ය මේකට අවශ්‍යමයි. දැන් අපි දැක්ක සමහර වෙලාවට සමහර දේශකයන් වහන්සේලා කියනවනෙ දැන් මේකට වීර්ය කරන්න ඕන නැහැ නිකං බලාගෙන ඉන්න කියල, එයා ඒ අවසාන මොහොතට හිත තියාගෙන ඉන්නව, එක්කෝ කවුරු හරි කියපු බණක් අහල, එක්කො එහෙම හරියන්නේ නෑ. ප්‍රත්‍යක්ෂතාවයට එනකොට තමයි තේරෙන්නේ මුලින් උත්සාහයෙන් වීර්යයෙන් අපි කලේ, දැන් අපට එහෙම අවශ්‍ය නෑනෙ. දැන් අපිට එනකොට පේනවනෙ, අන්න ඒ කෙනා සිත දිහා බලාගෙන ඉන්නවා, ඒකෙනා සිතිවිල වලට රිංගන්නේ නැ. අර මුලින් සිතිවිලි දැකල මිදි මිදී යන එක පුහුණු වෙන්න ඕන, ඒක පුහුණු විය යුතුමයි. ඒ කියන්නෙ සෝතාපන්න මාර්ගය වෙනයි අනාගාමි මාර්ගය වෙනයි. ඇයි මේ මාර්ග සිත් හතරක් තියෙන්නෙ. ඇයි මේ මාර්ග සිත් වල සිත් වෙන-වෙනම පනවන්නෙ. එහෙනම් ඕන්නෑනෙ එහෙම කරන්න මේ මාර්ගය වෙනයි ඒ තුල සෝතාපත්ති ඵලයට පැමිණෙනව. ඒ කියන්නෙ අර කන්දක් උඩ නැගල තැනිතලාවක් හමුවුනා වගේ. එයාට ඒ තැන හමුවෙනව, සිතිවිලි විතරයි කියල දැනෙනව, බාහිරය ඇත්තක් නෙමේ කියල ඒක තුල එයා හිරවෙලා හිටියොත් ඇත්තක් වෙලා එයාට අනාගාමී



www.buddothpado.com

වෙන්නෙ නෑ. එයා අනාගාමී වෙන්නේ එයා සකස් වෙන්න ඕන, එය සකස් කර ගන්න ඕන, මේ සිත සත්‍යක්ද කියල දැන ගන්න ඕන, සිතක් සත්‍යයත් නෙමේ කියලා දකිනකොට තමා අනාගාමී මාර්ගය හැදෙන්නෙ, එහෙම නැති වුනොත් එයා එක තැන හිරවෙලා, එතන පෙන්වන්නේ සෝතාපත්ති සමාධියක්, එතන පෙන්වන්නෙ ලෝකෝත්තර සමාධික්, ලෞකික සමාධි වෙනයි ලෝකෝත්තර සමාධි වෙනයි. ඒ භූමි පෙන්වනව මෙතන මේ මාර්ගය හදාගන්නෙ නැතිව ඒක එන්නෙ නෑ. මේ සෝතාපන්න මාර්ගයේ ඉන්නව නම්, සෝතාපන්න ඵලයට පත්වෙලා ඉන්නවනම්, එයාට හොදයි අනාගාමී මාර්ගයට එන එක, ඒ කෙනා මිත්‍යා දෘෂ්ඨිවල හිරවෙලා ඉන්නව නම් කොහෙ හරි දෘෂ්ඨියක හිරවෙල ඉන්නවනම් ඒක වෙන්නෙ නෑ, එතනත් දෘෂ්ඨි තියෙනව, එයා එතන හිරවෙලා ඉන්නත් පුළුවන්, සෝවාන් වෙලා හිරවෙලා ඉන්නත් පුළුවන්, සෝවාන් දෘෂ්ඨිය තුල , දැන් ඔබ දන්නව, ඔබට ධර්මය තුල අහන්න ලැබෙනවනෙ ඒ සෝවාන් ස්භාවය, ඒ ඵලය තුලම හිරවෙලා හිටපු අය. ඒ ඵලනේ අතන මාර්ගයනෙ එතනින් අනාගාමී මාර්ගයට ධර්මය මෙනෙහි කරන්න ඕන. එක්කෝ කල්‍යාන මිත්‍රයාගේ පණිවිඩයක් යටතේ, බුදුරජාණන් වහන්සේ ගොඩක් වෙලාවට එවගේ පණිවිඩ දෙනවනෙ, ධර්මය දේශනා කරනවනෙ ප්‍රායෝගික පැත්තට ආවොත් එහෙම ඔබ සකස් කර ගන්න ඕන. ඉතිං අරහත්වයටත් එහෙමයි අරහත් මාර්ග සිත්වල තමයි අපි අර කියන්නෙ, දැන් සිත දකිනව, සිත විතරයි. යනව එනව බලාගෙන ඉන්න එකක් තමයි අරහත් මාර්ගය තුල තියෙන්නෙ. මෙතන කරන්න දෙයක් නෑ අර 'ඕඝ තරනය' සූත්‍රය තුල තියෙන්නෙ එතනදි බිමට දානව ඔය ඔක්කොම



www.buddothpado.com

ටික පාරුවයි ඒ ඔක්කොම  බිමට දාලා, ඒ අරහත් මාර්ගය තුල සිතිවිලි යන එන ආකාරය නිහඬව බලාසිටීමක් තමයි සිද්ධ වෙන්නෙ. කරන්න දෙයක් නෑ එතකොට එතන සෝවාන් මාර්ගය තුල ඔබ විර්යය අරගෙන කටයුතු කරන්න, අනාගාමි මාර්ගය තුලත් ඒ නිමිත්ත, සමාධිය දකින්න. සෑම තැනකම ඒක තිබුණාට අනාගාමී භූමියෙන් පස්සේ  අරහත් මාර්ගය තුල කරන්න දෙයක් නෑ. ඇත්තටම ඕඝ තරණ සූත්‍රය තුළ තියෙන්නේ එන-යන සිත දකින්න සිත දිහා බලාගෙන සිටීමත් තමා සිද්ධවෙන්නේ. එතන අත්දැකීම් තියෙනව සෝතාපත්ති භූමියට පත්වෙලා අනාගාමි තත්වයට පත්වෙලා එතකොට එයාට හොහොමත් බාහිර ඇත්තක් වෙන්නේ නෑ. සිතත් ඇත්තක් වෙන්නේ නැ දෙකෙන්ම මිදිල එන අරමුණු වල කිසිම කථාවක් නෑ ශූන්‍යතාවය දකිනව. හැම අරමුණකම ශූන්‍යතාවය දකිනව, ඉතිං මෙතන  බොහොම දියුණුයි මේ කියන තැන් ටික ඔබ ඉන්න තැන අනුව, ඔබ ප්‍රතිපදාවේ පුහුණු වෙන තැන අනුව, ඔබ දකින්න. අපි ඔබට දෙන පණිවිඩය තමයි සති කමටහන තමා අපේ ගෙදර, සතිය තමා අපේ ගෙදර, අපි ගෙදරට වෙලා ඉන්න ඕන. අපි ගෙදරට වෙලා ඉන්නව කියන්නෙ මේ ඉන්න ගෙදරට වෙලා ඉන්න එකක් නෙමේ. සිත ඇතුලෙ අපේ දැන් තියෙනව භූමිය. ඒතමයි සතිය. අපි නිතරම ගෙදර එන්න ඕන. ඒ කියෙන්නෙ අපේ භූමිය, ඒ තමයි සතිය, සිතිවිලි එනකොට සිතුවිලි පස්සෙ සිත යනකොට ගෙදරට සිත ගන්න ඕන. සති කමටහනට ගන්න ඒ කියන්නෙ තමන් ප්‍රගුණ කරන ඒ සතියට ගන්න, නැවත සිතට එන අරමුණෙ සත්‍ය දකින්න, සත්‍ය දැකල එකෙන් මිදිල නැවත සතියෙ ඉන්න, සතිය තමයි මෙතන ප්‍රහලයා වෙන්නේ, සමාධියක් එන්නේ. ඉතිං එතන

ඉන්න එක හැම මොහොතකම ගෙදර ඉන්නව වගේ තමයි සතියෙ ඉන්නේ. හැම මොහොතකම තමන් හරි ශාන්තව, සැහැල්ලුවෙන් සතියට වෙලා ඉන්නෙ, ඒ කෙනා හරි පුදුමයි, හරි ආශ්චර්යමත් ගමනක් මේ නිවන් මග කොච්චර බාහිර ප්‍රශ්න තිබුණත් මිනිස්සු හිටියත්, මොනදේ කලත්, තමන් ඉන්නව සතියට වෙලා. සති කමටහනෙ, ගෙදර ඉන්නවා, තමන් මේ ආධ්‍යාත්මික මාර්ගය තුල යන කෙනාට ඒ අධ්‍යාත්මික දියුණුව එතනමයි ගෙදර. අපි අනන්තවත් තියනවනෙ මැරි මැරී උපදින සසරක් ගැන, ඒ කථාවක් නෑ මේ සතියට ආවට පස්සෙ. සතිය තමයි එයාගෙ ගෙදර, හෙට මැරුණත් සතියෙ, ඒ සම්මුතිය තුල අපි කියන්නෙ ඇත්තටම මේ සිතිවිලි එනව ඒවා පැටව් ගහනව, අතීතයේ ඒව එන එන විදිහට අපි ටක් ගාලා ඇදල ගන්නව ගෙදරට සිත, අර යෝනිසෝ මනසිකාරය ඒක තමයි සිහිය නුවණ ටක් ගාලා ඇදල ගන්නව, මේ සිත දුවනවනෙ කියල දැනගෙන ටක් ගාලා ඇදල ගන්නව. ආයෙත් සැහැල්ලුවෙන් ඉන්නව සුබය තුල, සතිය තුළ ඉන්නව. ආයිමත් අරමුණක් ආවහම ටක් ගාලා යථා භූත ඥානයෙන් දකිනව. ආයේ සතියට එනව ටක්ගාලා, සතියෙමයි ඉන්නෙ ඒකයි සමාධියෙ ඉන්නව කියන්නෙ. මේ අනිමිත්ත සමාධිය පිරිහෙන එකක් නෙමෙයි, ලෞකික සමාධි පිරිහුනාට ලෝකෝත්ර සමාධි පිරිහෙන්නේ නෑ. හොදට බලන්න මේ ප්‍රායෝගික පුහුණුව වෙන්න. දැන් ඔබ උත්සාහ කරන්න. දැන් නිවැරදි නිවන් මග ඔබට හමුවෙලා තියෙනව ඔබ ඒ අනුව කටයුතු කරන්න. එහෙනම් ඔබගේ දියුණුවට මේ සියල්ල හේතු වේවි.

## 02
# සිත කියල දෙයක් නෑ

අපි මෙම මාතෘකාව යටතේ පැහැදිලි කිරීම් මාලාවක් කරගෙන ආව. බොහෝ අය මේ ධර්මය පොත පතින් තමයි හදාරන්නෙ. ප්‍රායෝගික වෙන්න දැනුම තියෙනව ගොඩක් දැනුම ඔස්සේ හඹාගෙන යනවා. නමුත්, යමෙකුට හිතුනොත් මේ ධර්මය කියන්නේ පොතක තියෙන දෙයක් නෙමේ කියලා. බුදුන් වහන්සේ ලෝකයට හෙලි කරන්නේ දුකින් මිදෙන මඟක්. එහෙමනම් අපිට දුකින් මිදෙන්න ඕන. දුක කියන්නෙ අපි මේ දුක දිහා හොඳට බැලුවොත් මේ මම ඉන්න නිසා නේද දුක තියෙන්නෙ. මට දුකයි කියල නේද හැමෝම කියන්නේ. එයා නිසා මට දුකයි. ඒක කැඩුන එකට මට දුකයි. ඒක නැතිවුන එකට මට දුකයි. මේ විදිහට දුක පිළිබඳ විග්‍රහයන් ගොඩක් තියෙනවා. කැමති දේ නොලැබීම දුකයි. මේ විදිහට කොහොම වුනත් කථා කරන්නේ මට දුකයි කියලා. දුක තියෙන්නෙ කෙනෙකුටයි. කෙනෙක් නැතිනම් දුකක් නෑ. මේක බැලූ බැල්මට නොපෙනෙන අතිශය ගැඹුරු කථාවක්. හැබැයි මේක දැනගත්තට පස්සේ හරිම සරලයි. අපි මේ කථා කරනව නිවන ගැන බොහෝ අය උත්සාහ කරනව නිවන් දකින්න. එහෙම නේද? නිවීම, ගින්නක් තියෙනවනම් එකේ නිවීමකුත් තියෙනව. ඉතිං තෙලුත් ඉවරනම්, තිරත් ඉවර නම් පහන නිවී ගියේය. ගිය තැනක් කොයින්ද? මේ තමයි නිවනට දෙන උපමාව. මේ උපමාවත් අග්ගික්ඛන්දෝපම සූත්‍රයේ ඔබ දැක්ක නම් ගිනි ජාලාවකට, වියළි දරත් දමයිද, වියළි තණ කොලත් දමයිද, වියළි ගොමත් දමයිද, ගින්න දැල්වෙනව කියනවා. මේ විදිහෙ උපමා ගොඩක් තියෙනවා. හැබැයි මේක දැනුමක් නේද? මොහොතකට හරි ඔබට

හිතුනෙ නැද්ද මට හිතක් තියෙනවා. මගෙ හිත සතුටින්, මගෙ හිත දුකින්. මේ හිත නේද මේ සතුටු වෙන්නෙ දුක්වන්නෙ. එහෙනම් මේ සතුට/දුක තියෙන්නේ හිතක නේද? හිතක් කොතනද එතන දුකක් තියෙනව. එතන දුක/සැප දෙකම තියෙනවා. ඒක අන්තයක නවතින්නේ නෑ. ඒක් අන්තයක් තිබුණොත් අනිත් අන්තයත් තියෙනව. මේ අන්තයක් නැති ධර්මය බුදුන් වහන්සේ දේශනා කරන්නෙ. අපි දිගින් දිගටම පැහැදිලි කරගෙන ආව පර්යාය. පිටකය තුල තියෙන කරුණු. නමුත්, අද මේ කථා කරන්නෙ පරිබාහිර පැත්තකට අවිල්ල. පිටකයේ අපි සාරාංශ වශයෙන් දත්ත වශයෙන් න්‍යායාත්මක වශයෙන් දැනුමක් විදිහට ගොඩක් අය ඒව දන්නව. නමුත්, මේකෙ යථාර්ථයට ආවහම, ගොඩක් අය දන්නවද කියල ප්‍රශ්නයක් එනව. සත්‍යය අවබෝධ වෙලා නෑ ගොඩක් අයට දැනුම තුලම කෙනා ඉන්නවා නේද? දැනුම කියන්නෙ, දන්නවනම් එතන කෙනෙක් ඉන්නවනෙ. හැබැයි කෙනා නැති වෙනවා කියන්නෙ, දැනුමෙන් පලක් නෑ. මේක අති සුන්දර අති දාර්ශනික අති සියුම් කාරණාවක්. මේ නිවීම කුමක්ද කියන එක. ඔබ හොයන්නේ කුමක්ද? දුකින් මිදෙන මගක්ද? සසර ගින්නට විසඳුමක්ද? ඔබට විශ්වාසයක් තියෙනවද? ඔබ මේ ධර්මයේ කෙනෙක් ඉන්නවා කියලා. හෙට මෙලොවින් සමුගන්නා දවසේ නැවත උපතට යන්නේ නෑ කියලා. ඊට කලින් ඔබට ඒකේ අත්දැකීමක් තියෙනවද? සෝපදිසේස නිබ්බාන කියන්නේ පෙර අත්දැකීම් අනුපදිසේස නිබ්බාන කියන්නේ ඒ කය පොලවට පස්වීම. නමුත්, සෝපාදිසේස නිබ්බාන කියන්නේ සියලු කෙලෙස් නසල මේ අත්දැකීම ඊට කලින් ජීවත් වෙන කොටම ඔහු විදිනව. ඒ කියන්නේ සිතින් මිදිල. සෝපාදිසේස නිබ්බාන කියන්නේ

'නිබ්බින්දති විරාගන්ති විරාගන්ති නිරෝධන්ති. නිරෝධන්ති පටිනිග්ගානුස්සති' නැවත මේ සිත සකස් වෙන තැන දකිනව. එහෙනම් කුමක්ද මේ සිත, කුමක්ද මේ සකස් නොවෙන තැන. කෙනෙක් හිතන් ඉන්නවා කැමැත්ත ඉෂ්ඨ කරන්නෑ, දැන් මේ දකින අරමුන සිතට එන හැම අරමුණක්ම දෙයක්නේ, මෙය හැමෝම දන්න කාරණයක්නේ. සිතට එන අරමුණාගෙ සිත කියලා කියන්නෙ. ඒ අරමුණ අපි හිතමු දරුවෙක්ද, ගෙයක්ද, එහෙමෙ නැතිනම් ඕනෑම දෙයක් ඒක කැමැත්ත ඉෂ්ට කරන්නේ නෑ. ඒක අනිත්‍යයයි. ඒකෙ අනිත්‍යය දකිනවා ඒක කැඩිල බිඳිලා යන දෙයක් කියලා හිතනවා. එතකොට ඒකට ඇලෙන්නෙ නෑ කියනවා. එතකොට එහෙම තිතනකොට හිතනකොට ඒකෙන් මිදිල කොයි වෙලාවෙක හරි නිවන් දකිනවා කියලා හිතනවා. ඒක තමයි තණ්හාව ඒක ක්ෂය කරන්නයි ඔය උත්සාහ කරන්නෙ. හැබැයි ඔබ කරල බලන්න ඔබට තේරෙයි එකෙ කෙලවරක් නොමැති බව, ඒක ප්‍රායෝගිකව ඔබ උත්සාහ කරල කවුරුහරි කෙනෙක් එය කරල ඒක වෙනවනම් හොඳයි. ඒක වෙන්නෙ නෑනේ. ඔබට කරගෙන යනකොට තේරෙයි. අපිත් ඒ විදිහට කාලයක් කරල බැලුව. ඒ විදිහට වෙන්නෙ නෑ. හැමදාම බාහිර දෙයක් තියෙනවා. බාහිර දෙයක් තියෙන තාක් කල් එයා දුකින් මිදෙන්නෙ නෑ, අන්න සමුච්ඡේද ප්‍රහාණයකට යන්නේ නෑ. කැමැත්ත ඉෂ්ඨ කරන්නෙ නෑ කියලා හිතුවට සමුච්චේද ප්‍රහාණයකට යන්නෙ නැ. තදංග විදිහට යටපත් වීමක් සිදුවන්නෙ. සිත සමනය විමක් හැබැයි නිවනයි කියල රැවටිල ඉන්නව. ඒ කියන්නෙ ඔහු දුකින් මිදිල නෑ. රැවටීමක් වෙලා පමණයි. නැවතත් ඔහු සසර දුකට වැටෙනවා. ඒක නෙමේ නිවන් මග. තවත් කෙනෙක් කියනවා, මේ අද සමාජයේ



www.buddothpado.com

තියෙන දේවල් අපි කථාකරන්න ඕන මේවා හැමෝගෙම හිත්වල කැකෑරෙනවා. හැමෝගෙම හිත්වල තියෙනවා මේව. කෙනෙක් කියනවා දැන් මට තියෙන්නෙ රාග සිතක්, ඒ රාග සිතට දැන් ද්වේශ සිතයි රාග සිතයි මෝහ සිතයි කියලා රාග, ද්වේශ, මෝහ එන සිතේ අරමුණ වෙන්කර ගන්නව. මේක රාග සිතක් මේක ද්වේශ සිතක් කියලා දකිනව කියල. රාග සිතක් එනකොට දුක්ඛ සත්‍ය පෙන්වනව කියලා. ද්වේශ සිතක් එනකොට ඒකට අනාත්ම සඥද්ඥාව පෙන්වනව කියලා. ඉතින් මෝහ සිතක් එනකොට අනාත්ම සඤද්ඤාව පෙන්වනව කියලා. මේ විදිහට එන එන සිතට පෙන්වනව ඒ කියන්නෙ, එතකොට ඒ ලෝභ සිතක් එනකොට, ඒ දුක්ඛ සත්‍යය නම් දැන් ආශාවක් එනකොට ඒකෙ අනිත් පැත්ත දැන් දුක ඒකේ අසුභය පෙන්වනව නම්. ඒක තුනී වෙනව කියල. මේක ඇත්තටම මනංකල්පිතයි. සිතට, අරමුණට, ඒ කියන්නෙ ලෝභ, ද්වේශ, මෝහ අරමුණු වලට, ත්‍රිපිටක සූත්‍රවල බැලුවහම මේ විදිහට තමා වචන තියෙන්නෙ. එව වචන ඒ විදිහටම සරලව හිතනව, මෙහෙම කරන්න පුළුවන් කියලා. ලෝභ ද්වේශ මෝහ සිතට අනිත්‍ය, දුක්ඛ, අනාත්ම විදිහට බලනව, ලෝභ සිතට දුක පෙන්වනව. මෝහ සිතක් ආවහම ඒකට අනාත්තම සඤද්ඤාව පෙන්වනව. මෝහ සිතක් ආවහම අනිත්‍ය කියල සිහි කරනවා. අරමුණෙන් අරමුණට මෙහෙම පෙන්වගෙන පෙන්වගෙන ගියහම නිවන් දකී කියලා හිතනවා. ඒ විදිහටත් පුරුදු වෙනවා. අපිටත් ඕක ඇත්තටම භික්ෂූන් වහන්සේ නමක් තමයි ඒ විදිහට පුහුණු වෙනව කියලා. ඒ විදිහට කලොත් නිවන් දකිනව කියලා. මුල් අවස්ථාවල ඔය විදිහට පුරුදු වුනා. නමුත්, ඒකෙනුත් යටපත් වීමක් තියෙනවා. සමනය වීමක් තියෙනවා. හැබැයි,

කල්යනකොට තේරුණා මේකෙන් නිවන් දකින්නෙ නැති බව, හිටපු තැනමයි. ද්වේශය තියෙනවා බාහිර දෙයක් ඇත්ත කරගෙනයි මේ සියල්ල කරන්නෙ. ඒකයි අපි කියන්නෙ, රූපය ඇත්ත කරගෙන කියන බණ කිසිවක්ම මේ බුද්ධ දේශනයක් වෙන්නෙ නෑ කියලා. බුදුන් වහන්සේ රූපය 'නිච්ච තෝ අනිච්ච තෝ' කියන කොට හොඳට තේරෙනවා රූපං අනිච්චතෝ භන්තේ කියලා පිළිතුරු දෙන්නෙ. ඒ කියන්නෙ බාහිර දෙයක් ඇත්ත කරගෙන නිවන දකින්න බෑ. බාහිර දෙයක් තියෙන තැනම දුකමයි තියෙන්නෙ. දුකින් මිදීමක් නෑ. ඉතින් ඔබ දකින්න සමහරවිට ප්‍රතිපදාවන් කියලා හිතාගෙන කවුරු හරි කෙනෙක් ඔබට දීපු කමටහනක් විදිහට ඔබ ගමන් කරනවා, කටයුතු කරනවා වෙන්න පුළුවන්. ඒක අහිංසක උත්සාහයක්. යෝගාවචරයින් විදිහට අපි ද්වේශයෙන් කථා කරනවා නෙමේ, අපි අසරණ වෙනවා වැරදිලා තමයි කව්රුත් හරි දේ සොයා ගන්නෙ. ඉතිං බොහොම අනුකම්පාවෙන් අපිත් මේ දිහා බලන්නෙ. බොහොම නිහතමානීව කියන්නෙ. ඔබගේ දෘෂ්ඨි මොකුත් වෙනස් කරන්න අපිට අදහසක් නෑ. තම තමා උත්සාහ කරල නිවරදිනම් කමක් නෑ. ඔබගේ ජීවිත කාලය බොහොම කෙටියි. ලොකු කාලයක් නෑ. ඒ නිසා ඒ නිවැරදි දේ ඔබ විසින්ම සොයාගන්න ඕන. ඔබට ගැලපෙන කමටහන ඔබ විසින්මයි සොයා ගන්න ඕන. සකස් කර ගන්න ඕනි. අන් අය මත පටවන්න එපා මේ නිවන තමන් විසින්මයි සොයාගන්න ඕන. කල්‍යාණ මිත්‍රයාට පුලුවන් පණිවිඩය කියන්න විතරයි. මාර්ගයේ යන්න ඕන තමන්මයි බුදු කෙනෙකුටවත් බෑ කවවත් නිවන්දක්වන්න. ඒ සත්‍යයයේ පණිවිඩය පමණයි කියන්න පුළුවන්. ඒක අහන් ඉන්න කෙනා තේරුම්ගන්න විදිහ අනුව



www.buddothpado.com

වෙනස් වෙන්න පුළුවන්. නිවැරදිව හරියටම නියම දෘෂ්ඨි කෝණයට යොමු වෙනකම් නිවන් අවබෝධයක් සිද්ධ වෙන්නෙ නෑ. නිර්වාණය අවබෝධ වෙන්නෙ නෑ. ඒක අති දුර්ලභයි ප්‍රසිද්ධියේ බන්දේසියේ තියල වෙන්දේසිකලාට ප්‍රසිද්ධ වෙන්නේ නෑ. ප්‍රසිද්ධ වෙන්නෙම ලාමක දෙයක්. කවදාවත් ගම්භීර අර්තාවූ ඒ ශ්‍රී සද්ධර්මය ප්‍රසිද්ධ වෙන්නෙ නෑ ලේසියෙන්. ඒක මනුස්ස හිතට දරාගන්න අපහසු නිසා ඒක ප්‍රතික්ෂේප වෙනව. ඒක අපිට පේනව. නමුත්, අපි සත්‍ය මයි සොයා ගත යුත්තෙ. අපි කියන්නෙ නෑ මේ අපි කියන දේ තමයි සත්‍ය, අනිත් අය කියන දේ වැරදියි කියලා. අපිට එහෙම කියන්න අවශ්‍යතාවයකුත් නෑ. අපි අත්දැකීමෙන් ප්‍රකාශ කරනවා පමණයි. ඒ අනුව අපි සාක්ෂාත් කරගත්ත දේ අපි ප්‍රකාශ කරනවා. ඒක සැක කරන්න ඕනම කෙනෙකුට අයිතියක් තියෙනවා. අපි කියන් නෑ එපා කියලා. නමුත්, කාට හරි විශ්වාසයක් ඇතිවුනොත්, කවුරුහරි කරල බැලුවොත්, ප්‍රත්‍යක්ෂ උනොත්, විතරක් ඔබ මේක භාරගන්න. නැතිනම් ප්‍රතික්ෂේප කරන්න. අයින් කරල දාන්න. අපිට ප්‍රත්‍යක්ෂ වුන ආකාරය අපි දන්නවා, ඒ දේ අපි පණිවිඩයක් හැටියට තව කෙනෙකුට දිය යුතු නිසා යුතුකම විතරයි අපි මේ කරන්නෙ. මේකමයි කියන එක නෙමේ මේ තේරුම. අන්තයකට බැහැල නෑ. අපි බොහොම නිර්මලව බොහොම සුහදව අපි හැමෝම දෙස බලනවා. ඔබට කියන්න ඕන කාරණා බොහොමයක්ම තියෙනවා. සිත කියලා ඇත්තටම බැලුවොත්, සිත කියලා දෙයක් හමුවෙන්නෙ නෑ ඔබට මේ ධර්මය ප්‍රත්‍යක්ෂ වෙනකොට, ඔබ ඔතනම ගැටෙයි. එහෙනම් මෙච්චර පොත් ලියල තියෙන්නෙ, එහෙනම් මෙච්චර දේවල් මේ තියෙන්නෙ. ඔබ කොහොමද කියන්නෙ නෑ කියලා. ඇයි සිත ගැන



www.buddothpado.com

මෙච්චර දේවල් කථා කරන්නෙ. ඒ ඔබගේ තර්ක විතර්ක ඔබ ගාවම තබා ගන්න. අපිට කිසිදු තර්කයක් නෑ. මේ ධර්මය 'අතක්කාවචර ධර්මයක්' මේක තර්කයකට නගන්න බෑ. ඇත්තටම සිත කියලා දෙයක් නෑ. පවතින දෙයක් නෑ. එහෙනම් අපි මේ සිතන්නෙ අපිට හිතක් තියෙන්නේ, අපි මේ කල්පනා කරන්නෙ. ඔහොම කීවහම ඔහොම තමා උත්තර දෙන්නෙ. ඇත්ත බැලූ බැල්මට පෙන්නෙ එහෙමයි. ඔබටත් හිතෙන්නෙ එහෙමයි. එය අවබෝධ කරගන්න ලේසි නෑ. මොකක්ද මේ කියන්නෙ තව ටිකක් හොඳින් බලන්න. සිත කියන්නෙ එතන. එතන සකස් වෙවී නැතිවෙනවා පවතින්නෙ නෑ. මෙක ප්‍රත්‍යක්ෂ කරගනයි. මේ සේරම සමථ විදර්ශනා යුගනද්ධ ඔය සේරම සතර සතිපට්ඨානය වේවා ආර්ය අෂ්ඨාංගික මාර්ගය, සත්තිස් බෝධි පාක්ෂිත ධර්ම ඔය කියන හැම දේම, එතන-එතන සකස් වෙන ඇතිවෙන නැතිවෙන ස්වභාවය අඳුන ගන්න කරන ඒ කටයුතු මේක මාණික්‍යරත්නයක් වගේ. මේ වචන ටික ඉතාම වැදගත්. පවතින සිතක් නෑ. අපිට හිතෙන්නෙම අපි මේ ඉන්නවා නෑ මේ තියෙනවා කියලා එහෙම අන්තයකට දාල කියලා ස්ථිරව කරන්න බෑ. ඇත කිව්වත් වැරදි නැත කීවත් වැරදි. ඇත කීවත් තිබ්ල තියෙනවා. නැත කීවත් තිබ්ල තියෙනවා. තියෙනවා කියන කමම වැරදියි මේකෙ. ඒකයි බුදු කෙනෙක් ලෝකයට ධර්ම දේශනා කරන්නෙ, 'මජ්ඣෙධ ඥාණං' කියන තැනින්, මධ්‍යම ප්‍රතිපදාවෙන් කියන තැනින් එකයි. කාටවත් ඒක හරියට තේරෙන්නේ නත්තේ. ඔබ දකින්න දැන් මේ 'මජ්ජේ ඥාණං' කියන තැන මේ මධ්‍යම ප්‍රතිපදාවෙන් පමණාමයි බුදුකෙනෙක් ධර්මය දේශනා කරන්නේ කියන එක පමණක්, අපි ඒකට ඒ විදියේ දේශනයක් ඉදිරිපත් කළා. බලන්න



www.buddothpado.com

කොයිතරම් ඒකට අපිට ප්‍රතිචාර දීලා තියෙනවද? ඒ විදිහට අපි දන්නවා. අපි කියන්නෙ කොහොමද? කොහොමද මධ්‍යම ප්‍රතිපදාවෙන් ධර්මය දේශනාකරන්නෙ. ඒක මේ සමාජයට තාම වැටහිලා නෑ. ඔය ත්‍රිපිටකයේ තියෙන බුදුන්වහන්සේ දේශනා කරලා තියෙන හැම තැනම තියෙන්නේ මධ්‍යම ප්‍රතිපදාවෙන්. ඒක දකින්නෙ ඒක අවබෝධ වුන කෙනෙක් විතරයි. ඒක පේන්නෙ සූත්‍රය බැලුවම, හැමවිටම තමන්ගේ කෝණයෙන් බැලුවම ඒක තමයි ඇත්ත ඒක අසරණකමක්, හැමෝටම පේන්නෙ එහෙමයි. ඒක තමයි ස්වභාවය. නමුත්, ඒක අවබෝධ වුන කෙනාට ඇත්ත පේනවා. ඒකයි 'රූපං නිච්චතෝ අනිච්චතෝ අනිච්චං භන්තේ' කියලා කියන්නේ. ඒක හැම දේටම කියනවා. වේදනාව නිත්‍යද අනිත්‍යද, අනිත්‍යයයි, සඤ්ඤා නිත්‍යද අනිත්‍යද, අනිත්‍යයයි. සංඛාර අනිත්‍යද නිත්‍යද අනිත්‍යයි. විඤ්ඤාණය නිත්‍යයද අනිත්‍යයද, අනිත්‍යයි මේ මොකක්ද මේ කියන්නේ සිත කියල දෙයක් නෑ. ස්කන්ධයමයි සිත නම්. එහෙමනම් ස්කන්ධයම රූප අනිච්චං භන්තේ නම්, වේදනා අනිච්චං භන්තේ නම් සංඥා අනිච්චං භන්තේ නම්, සංඛාර අනිච්චං භන්තේ නම් සියල්ලම අනිත්‍යයයි. පවතින්නෑ. පවතින සිතක් නෑ. ඔබට මේක විශ්වාසයක් නැතිවෙන්න පුළුවන්. පිළිගන්නෙ නැතිවෙන්න පුළුවන්. එකනිසා ඔබ මේකත් සිතේ එක් තැනක තබා ගන්න. ඔබ කියන විදියට ඔබ ටිකක් හැම දෙයක් ගැනම විවේකී වෙලාවක ඔබට ධර්මය මෙනෙහි වෙන විදර්ශනා මොහොතට යම් මොහොතක සිහියට එයි, මෙවැනි පණිවිඩයක් මට කල්‍යාණ මිත්‍රයෙකුගෙන් ලැබුණ. සිත කියලා දෙයක් නෑ කියලා. අන්න ඒක අවබෝධ කරගන්නයි අපි මේ දඟලන්නෙ. ඒක තමයි ඔබට අවසානයේ අවබෝධ වෙන්නෙ. ශූන්‍යයි



www.buddothpado.com

කියන්නේ ඒකයි. 'ශූන්‍යත පටිසංයුත්ත' දේශනා කියලා කියන්නෙ ඒකයි. ශූන්‍යතාවයටම යන්න කියන්නෙ ඒකයි. ශූන්‍යයි ශූන්‍යයි කීවට ගොඩාක් දෙනෙකුට මේක තේරෙන්නෙ නෑ. හිතන් ඉන්නවා මේ බඩුමුට්ටුවල දෙයක් නෑ වගේ එකක් කියලා එහෙම එකක් නෙවේ මේක. භාෂාව තුල මේ පෙන්වන හැම දෙයක් තුලම දෙයක් තියෙනවා. නැතිනම් නෑ. ඇත/නැත අන්ත දෙකේ භාෂාව හිරවෙලා තියෙන්නේ. අපි කියනවා මේ භාෂාවෙන් ධර්මය කියන්න බෑ කියලා. ඒකට හේතුව මේකයි, භාෂාවට අන්තයක් තියෙනවා. ධර්මයට අන්තයක් නෑ. අන්තයක් නැති ධර්මයක් අන්තයක් ඇති භාෂාවකින් කෙහොමද දේශනා කරන්නේ. ඒකයි මේකෙ තියෙන සියුම්කම අර සෙයා ගත්ත අපහසුතාවය තියෙන්නේ ඒ නිසාමයි. බොහෝ අයට මේවා වැටහෙන්නේ නැත්තේ ඒ නිසාමයි. සිත කියලා දෙයක් නෑ. ඒකයි ඇත්ත. සිත හටගෙන නිරුද්ධවෙනවා එතන එතන හටගෙන, තත්‍ර තත්‍ර විපස්සති එතන - එතන හොඳින් බලන්න. උදය, වය ඤාණ, භය ඤාණ, භයතු පට්ඨාන ඤාණ මුඤ්චිතුකම්‍යතා ඤාණ පටිසංඛාර ඤාණ සංඛාරවිපස්සනා ඤාණ, ආදී මේ ඤාණ කියන්නේ මොනවාද? දස ඤාණ කියන්නේ මොනවාද? මේ සිත නෙමෙයි. අපි ඒක සැරෙන් සැරේට කීවා. මේක සිත නෙමෙයි කියල, මේඋදයව්‍ය ඤාණ ඇතිවන නැතිවන සිතේ හටගෙන නිරුද්ධ වන ආකාරය තෙක්. ඔබ දකිනවා ඒවා, ගොඩක් අපි කියලා තියෙනවා.

'අනිච්චාවත සංඛාරා - උප්පාද වයධම්මිනෝ
උප්පජිත්වා නිරුජ්ඣන්ති - තේසං වූප සමෝ සුඛෝ'

මේ ඔක්කොම එකම කථාව උප්පාද වයධම්මිනෝ, මේ සිත අරමුණු උප්පජ්ඣිත්වා නිරුජ්ඣන්ති, එතන එතන නැති වන

කතා, දැන් බලන්න භද්දෙකරත්න සූත්‍රයට ගියත් ඉතාම වැදගත් සූත්‍රයක්.

‘අතීතං නාපග්ගමේය- අප්පටිකංඛෙ අනාගතා
පච්චුප්පන්නාසයේ ධම්මා - තත්‍ර තත්‍ර විපස්සති’

පච්චුප්පන්න යේ ධම්මා තත්‍ර තත්‍ර විපස්සති. හටගෙන නිරුද්ධවන ධර්මතාවයක් එතන එතන බලන්න කීම. මේ සිත, මේ ධර්මය පැහැදිලි කරන කොට අපි ගොඩක්ම කලේ මොකක්ද? පොත දකින හිත නෙමේ බිත්තිය දකින්නේ. බිත්තිය දකින හිත නෙමේ මල දකින්නේ. මල දකින හිත නෙමේ පුටුව දකින්නේ. පුටුව දකින හිත නෙමේ පොලව දකින්නෙ. මේ සිත් පරම්පරාව අපි කියාගෙන යන්නේ පොත දකින හිත එතැන-එතැන ඇතිවෙලා නැතිවුනා කියලා බිත්තිය දකින හිත එතන - එතන ඇතිවෙලා නැතිවුනා කියලා, අපි කියන්නේ එතන එතනම නැතිවෙනවා කියලා. හටගෙන නිරුද්ධ වෙනවා. මේ ‘ස්පාර්ක්’ එකක් කියලා කියන්නේ සිත. අපි මේ විදිහට ගොඩක් පැහැදිළි කරගෙන ආව. ඔබට ඒවා අහන්න ලැබෙයි. දේශනා සියගණනක් පොඩ්ඩක් නෙමේ. පුදුමත් හිතෙයි මෙච්චර වීර්යක් මෙයා අරගෙන මේ කියන්නේ මොකක්ද? මේක නේද? මේ කියන්නේ. ‘අවුත්වා සම්බුතං වුත්වානං භවිස්සති’ පෙර නොතිබීම හට ගත්ත. ඉතිරි නැතිවම නිරුද්ධ වුනා. එතකොට ඇයි මෙහෙම මෙයා කියන්නෙ. මේක කියන්න හේතුව මේක ප්‍රත්‍යක්ෂතාවයට පත්වුනා දැක්කා. ඒ ප්‍රත්‍යක්ෂ ඤාණයට හසුවුනා. එතකොට අපට කියන්න සිද්ධවුනා මේක එතකොට එක එක්කෙනා කියන්න පටන්ගත්තා එක එක දේවල් තියෙනවා නමුත්, අපට තේරෙන්නෙ මේක කියලා අපි කීවා අපි කීවේ කාගෙවත් ඒවා නෙමේ. අපි කීවේ අපේම උදාහරණ



www.buddothpado.com

අපිටම පේන දේවල්. අපිටම දැනෙන විදියට එක එතන එතනම සත්‍ය පෙන්නනුවා. ඒ නිර්මල ශ්‍රී සද්ධර්මය කියලා කීවා. ඒක පොතක ලියන්න අපහසු බව අපි කීවා. ගොඩක් අය හිතාන ඉන්නවා මේ ත්‍රිපිටකය මේක හරි. මේ මේක ඔක්කොම කටපාඩම් කරගත්තොත් හරි. මේකෙ තියෙන්නෙ කියලා, මේක නෙමේ තියෙන්නෙ. ඔබේ සිතේ තියෙන්නේ නිවන. සිතක් කොතනද ඒ සත්‍ය දකින තැන, නිවනත් එතැනමයි. සිතක් නැති බව දැකීමයි නිවන. එයයි නිවන. ඒක පොතක ලියන්න බෑ. මොකද ඔබට ඒ ප්‍රත්‍යක්ෂතාවයට පත්වෙන කොට ඔබට ඒ එන අත්දැකීම් පොතක කවදාවත් ලියන්න බෑ. ලුණු රස කවදාහරි පොතක ලියන්න පුළුවන්වෙයිද? කවදාවත් ලියන්න බෑ. පුළුවන් වේවිද ලුණු රස පොතක ලියන්න. අවුරුදු පන්දහසක් ලියුවත්, ලුණු රස පොතේ ලියන්න බෑ. ඒකට තර්ක නෑ. ඒ වගේ අවුරුදු පන්දහසක් පොතේ ලීවත්, නිවන ගැන පොතේ ලියන්න බෑ. ඒකට තර්ක නෑ. ඒක ඥාණයක්. ඥාණයට හසුවන එකක්. ඒක ඥාණයට හසුවන්නෙ ලියන්න බෑ. අපිට පොතෙන් දෙන්න පුළුවන් ඒ සාධක ටික. නමුත්, ඒ සාධක ටික අප තුලින් අපි දකින තුරු අපි දන්නේ නෑ. ඔබ ලුණු කන කම් කවදාවත් ඔබ ලුණු ගැන දන්නේ නෑ. ඔබ නිවන, ඔබට ප්‍රත්‍යක්ෂ වෙනකම් කවදාවත් ඔබට පොතකින් හොයන්න බෑ. ඔබ මිය යයි. නිවන නම් හම්බවෙන්නේනෑ පොතකින්, නිවන, ඔබ සිත තුලින් මිදීම තුල ඔබට ප්‍රත්‍යක්ෂ විය යුතුමයි. එකයි මේක සාන්දිෂ්ඨික ධර්මයක් කියන්නේ. මේ සිතක් පවතින් නැතිනම්, සිත කියලා දෙයක් නැති නම්, එතන-එතන හටගෙන නිරුද්ධ වෙනවනම් කාලයක් කොයින්ද? මේක අකාලික ධර්මයක් කීවේ ඒකයි. දැන් මේ මොහොතේ සිතක්

හටගෙන නැතිවෙනවා. දැන් කොහෙන්ද කාලයක් එච්චරයි තියෙන්නෙ. මේ මුළු ලෝකයෙම එච්චරයි වෙන්නෙ සැම මොහොතෙම ඒක වෙනව ඔබ මැරෙන මොහොතෙදිත් එච්චරයි. සිතක් හට අරගෙන නිරුද්ධ වෙනවා එච්චරයි. හැම මොහොතෙම මේක හට අරගෙන නිරුද්ධ වෙනවා එච්චරයි. මේකට කාලයක් කොයින්ද? මේවා ඔක්කොම අපි විසින් හදාගත්ත සම්මුති. එහෙම එකක් නෑ. අකාලික ධර්මතාවයක් ලෝකයේ පවතිනවා. ඒ ධර්මතාවයක් ඒක. ඒක 'අතක්කාවචර' ධර්මයක්. කියන්නේ මේක තර්ක කරලා කටවත් පලක් නෑ. 'ලුණු' රස පොතත ලියන්න බෑ වගේ කවදාවත් තර්ක කරලා ඔප්පු කරන්න පුළුවන්ද? ඒවගේ තමා මේක 'අතක්කාවචරයි'. මේ පරම සත්‍ය තර්ක කරන්න පුළුවන් දෙයක් නෙමේ. තර්කයට ගන්න බෑ. ඉතින් මේ සත්‍ය තමයි ඔබ අවබෝධ කරගන්න ඕනෙ. මේක සාන්දිට්ඨික ධර්මයක් වුනේ ඇයි. මේක කාටවත් කාටවත් කියල දෙන්න බෑ. කාටවත් දෙන්න බෑ. ඇයි ඒ තමන්ටම සාන්දිට්ඨික වෙන්න ඕන. තමන්ටම ප්‍රත්‍යක්ෂ වෙන්න ඕන. 'ලුණු රස' ඔබ කන ලුණු රස ඔබට දැනෙනව මිසක් තව කෙනෙකුට දනවන්නේ කොහොමද? ඔබටමයි සාන්දිට්ඨික, අන්න ඇත්ත ඒකමයි මෙතන තියෙන්නෙ. සාන්දිට්ඨික ධර්මයක් කීවේ ඒකයි. 'සාන්දිට්ඨිකෝ, අකාලිකෝ ඒහිපස්සිකෝ' ඕන කෙකෙතුට මේක බලන්න පුළුවන්. ඕපනයිකෝ, තමන්ටම මේක ප්‍රත්‍යක්ෂතාවයට එනකම් කවුරුත් එහෙම කියන්න පුළුවන් එකක් නෙමේ. ඕපනයිකෝ සාන්දට්ඨිකෝ ඒහිපස්සිකෝ ඕපනයිකෝ පච්චුප්පන්න ධර්මයක්. හටගෙන නිරුද්ධවන ධර්මතාවයන්. ඒකයි මේ ධර්මතාවය පමණයි ලෝකයේ පවතින්නේ. වෙන දෙයක් නෑ. ඒකයි 'සෝ ධම්මං

පස්සති සෝ මං පස්සති' කියලා බුදුන් වහන්සේ පෙන්නුවෙ. ධර්මය තුලින් මාව දකින්න කියලා. මේ බුද්ධ කියන්නේ අපි කීව කෙනා නෙමේ කියලා. මේ සිත කියලා දෙයක් නැති තැන බුද්ධ ස්වභාවය තියෙනවා කියලා අපි කීවා. තර්ක කරන්න, මේ ගැන එක - එක ඒවා ඔබගේ බොළඳ කමට ඔබගේම අසරණ කම තමා ඔබ පෙන්වන්නේ. එහෙම දේකට යන්න එපා. මේ පරම සත්‍යක්. මේ බුද්ධ ස්වභාවය කියන්නේ එක ස්වභාවයක්. මේ සම්මුතිය තුල තියෙන වචනයක් ඕකට 'ශුන්‍යතාවයක්' තියෙනවා. ඒ තුල කෙලෙස් මුකුත් නෑ. ඒ තුල කිසිම දෙයක් නෑ. ඒකයි සියල්ල සංඛතයි. නිවන අසංකත එකම ලෝකේ නිවන පමණක් වෙන්නේ. සියල්ල සකස්වෙනවා නිවන සකස් නොවෙන්නේ කොහොමද? මේක සකස් වෙන දෙයක් නෙමේ. සියල්ල සකස් වෙන බව අවබෝධවීමක් මේක හරි ගැඹුරුයි. හැබැයි මේක හරි සරලයි නේද එහෙම බැලුවහම. දැන් මෙතන සිත කියලා දෙයක් නෑ. හටගෙන නිරුද්ධ වෙනව. පවතින දෙයක් පෙන්වන්නවත් එහෙම දෙයක් නෑ. අපිට දුක්වෙන්න - සතුටුවෙන්න හේතු නෑ. ඒක එතනින් ඉවරයි. හැම සිතක්ම එතන-එතන ඉවර වෙනව. හටගෙන නිරුද්ධ වෙනව. ඒක අපි ශේෂ කරගත්තොත් අන්න අවශේෂයක් වෙනව. නිරවශේෂ විරාග නිරෝධයක් තමා නිවන කියලා කියන්නෙ. නිරවශේෂ කියන්නේ අවශේෂයක් එතන නෑ. මෙතන පොත දකින සිත එතන හට ගෙන නිරුද්ධ වුනා. අයේ ශේෂයන් නෑ. නිරවශේෂයි. බිත්තිය දකින හිත එතන හටගෙන නිරුද්ධ වුනා. අවශේෂයක් නෑ. නිරවශේෂයි. මේ වචන පාවිච්චි කරනව විතරයි. සම්මුතිය තුල, මේ ගම්භීර අර්ථය ඔබ අවබෝධ කරගන්න, ගාම්භීර අර්ථයක් හැම ක්ෂණායකම,

එකයි අපි කීවේ එන්කෂණියක උපත මරණය දකින්නාට සම්මුතිය තුල මරණය හමු නොවේ. සදාතනික සුවයක් දැනෙන්නෙ. සදාතනික සුවයක් මෙතන සිත කියන්නෙ ප්‍රවාහයක්. සුළඟ වගේ, සුළඟට ආරම්භයක් තියෙනවද? අවසානයක් තියෙනවද? අන්තයක් පනවන්න පුළුවන්ද? අන්න ඔබට දැන් වැටහෙනව අන්තයක් නෑ. අන්තයක් පනවන්න බෑ. මජ්ඣෙධඣදාණං කීවෙ ඒකයි. මධ්‍යම ප්‍රතිපදාව කීවෙ ඒකයි. අන්තයක් ගන්න බෑ. හටගෙන නිරුද්ධවන ධර්මතාවයක් එක ප්‍රවාහයක්. අපට කවදාවත් ඒක පෙන්වන්න බෑ. සිතක් පෙන්වන්න බෑ. සිත කියල දෙයක් ලෝකෙ කොහෙවත් නෑ. හැබැයි මේක අවබෝධ කලොත් ඔබ සොබාදහම වගේ දෙයක් තමා අවබෝධ කරන්නෙ. සුළඟ වගේ දෙයක්. සුළඟ කොහෙද තියෙන්නෙ. සුළඟ ඔබට පෙන්වන්න පුළුවන්ද? අපි ඒක නිසා මේ වගේ උපමා ගොඩක් පෙන්නුවා. අන්තයක් නැති ඒවා. ගඟ ගඟ කියලා දෙයක් පෙන්වන්න බෑ. ඇල්ලුවොත් වතුර ටිකක්. දැන් ගඟ කියන්නේ ප්‍රවාහයක් ගලනවා. සුළඟ කියන්නේ ප්‍රවාහයක් ගලනවට. වැස්ස කියන්නෙ ප්‍රවාහයක් වතුර බිංදු වැටෙනවට. ඔය එකකවත් අන්තයක් පණවන්න බෑ. එහෙම දෙයක් නෑ. දෘෂ්ඨියක්, දැන් ගඟ කියන්නේ දෘෂ්ඨියක් නෙමේද, ගඟ අල්ලන්න පුළුවන්ද? සුළඟ අල්ලන්න පුළුවන්ද? ඒක ප්‍රවාහයක්. වැස්ස අල්ලන්න පුළුවන්ද බෑ. ප්‍රවාහයක්. සිත අල්ලන්න පුළුවන්ද බෑ. ප්‍රවාහයක්. මේ චිත්ත වීථි හැම දෙයක්ම දාල තියෙන්නෙ ඇයි මේ මෙක පෙන්වන්න. මෙහෙම දෙයක් නැ මේක ප්‍රවාහයක්. මේ මහා ශුන්‍යතාවයක්, ගොඩක් කථා කරන්න විග්‍රහ කරන්න, වචන ගොඩක් දැමීමට මොකුත් නෑ. අර අපට එක කථාවක් තියෙනවා. ඒත් ඒව තේරුමක්



www.buddothpado.com

නෑනෙ නේද? අර ලොකු යුද්ධයක් කරල පෙට්ටියක් සොයාගෙන, ඇරලා බලනකොට මුකුත් නෑ, ඒක හිස් පෙට්ටියක්. මෙන්න මේ වගේ මහා නිධානයක් කියලා හිතාගෙන යුද්ධයක් කරල මහා නිධානයක් ලබාගන්නවා. අවසානයේ ඒක ඇතුලෙ මොකුත් නෑ. අවසානයේ විශාල යුද්ධයක් විතරයි මේ වගේ අපිත් ලොකු වෑයමක් කරල නිවන් දකින්න කියලා විශාල අරගලයක් කරල අවසානයේ අපට ලැබෙන දෙයක් නෑ. හේතුව මෙතන නිවන කියල දෙයක් නෑ. මෙතන අවබෝධ කරගැනීමක් මේක තමයි ඇත්ත. මේ සිස්ටම් එක හැදෙන හැටි තමා අපි දිගින් දිගටම පැහැදිලි කරගෙන එන්නෙ. සිත හැදෙන්නෙ කොහොමද? සිත කියල දෙයක් ඇත්තටම අපි මුල් දේශනා වලට ඔබ ගියොත්, එහෙම අපි ඔබට ඉදිරිපත් කරනව ආර්‍යය දේශනා, පරම සත්‍ය ඔය නම් වලින් පරම සත්‍ය කියල ඉදිරිපත් කරන්නේ සත්‍යයේ මහා සිංහ නාදය කියලා, මොනවද මේ ඉදිරිපත් කරන්නේ ඔය ඉදිරිපත් කරන්නේ සිත කියල දෙයක් නැති බව. අපි මේ මුකුත් හොයාගෙන යනව නෙමෙයි. නැති බව අපි ප්‍රත්‍යක්ෂ කරගන්නයි උත්සාහ කරන්නෙ. සිත කියලා දෙයක් නැති බව ප්‍රත්‍යක්ෂ කරගන්න දරන වෙහෙස තමයි නිවන් දකිනව කියල කියන්නෙ, ඔය වෙනුවෙන් තමයි ඔය කමටහන් හැම දෙයක්ම කරන්නෙ. හරි පුදුම හිතෙයි ඔබට මේ කථාව ඇහුවම ඇත්ත කථාව ඒකයි. හරි නිර්මල කථාවත් ඒක අපි ප්‍රතිපදාව තුනකට බෙදලා සෝවාන්, සකෘදාගාමී. අනාගාමී අරහත් කියල මේ යන්නෙ එතනට දර්ශනය දකිනව කියන්නේ ඕක. දර්ශනය කියල අන්තදෙක පෙන්නුව බුදුන්වහන්සේ 'අජ්ජත්ත භහිජ්ජා කියල' බාහිර /සිත කියල පෙන්නුව ඊට පස්සේ බාහිරත් සත්‍යක් නෙමේ. සිතත් සත්‍යක් නෙමෙයි,

දෙකම බාහිරෙන් මිදෙනව දෙකම සිතිවිලි. පේනව නෙමේ සිතනව, මේ ප්‍රතිපදාවේ මූලික අදියර සෝවාන් කියල පෙන්නුව. ඊට පස්සේ පෙන්නුවා සිතත් සත්‍යයක් නෙමේ කියලා සිතේ මොකුත් දේවල් කියලා නෑනෙ. දැන් සිතට අරමුණක් එනව, අරමුණක් එන එකමනෙ සිත කියන්නෙ. අරමුණ තමා ශූන්‍යවෙලා යන්නෙ. අරමුණ කියලා එකක් නෑ. නමුත්, සිතට එනව එන එක එතනම නැතිවෙනව කියන එක තමයි අවබෝධ වෙන්නේ. ඒකයි උදයව්‍යඥාණය හැටියට එන්නෙ. සත්‍ය ඥාණය කියන්නෙ සත්‍ය දකින ඥාණය. විඥාණය අනිත්‍ය දැකීමයි සත්‍ය කියලා පෙන්නුව. 'ප්‍රඥ්ඥා' කියන්නේ විඥ්ඥාණයේ අනිත්‍ය දැකීමයි. භාවේතබ්බං විඥ්ඥාණං පරිඥෙඥ්ඥ්යං' කියල කීවෙ ඒකයි. එතකොට මේ සිතමයි විඥ්ඥාණය කියන්නෙ. 'පඥ්ඥා භාවේතබ්බං විඥ්ඥාණං පරිඥෙඥ්ඥ්යං' විඥාණය අනිත්‍යයි සිත දැකීම ප්‍රඥාවයි. සිත කොහොමද අනිත්‍ය කියන්නෙ. සිතක නැති බව. සිත නැති බව දැකීමයි ප්‍රඥාව. සිතක් නැති බව දැකීමයි ප්‍රඥාව කියන්නෙ. ගොඩක් විස්තර කරනකොට තේරෙන්නෙ නෑ. එක පාරටම කීවට, මේ මට හිතක් තියෙනවනෙ, මේ මට පේනවනේ, මේ මට ඇහෙනවනෙ, මේ මට දැනෙනවනෙ, මේ මට හිතෙනවනෙ ඔන්න ඕක තමා අපි ගලවා ගන්න ඕන, මේක අවබෝධ කරන්න ඕන. මොකද මේ ආයතන හරහා ද්වාර හාරහා මේ එන අරමුණු විසින් අපට දෙන මේ සඥ්ඥාව දෙයක් තියෙන බව. ඒකට අපි තියෙන බව ප්‍රතක්‍ෂ වෙලා. සාමාන්‍ය මනුෂ්‍යායාගේ ස්වභාවය මේ ලෝකෙ තියෙනව කියලා. මේ ලෝකෙ ඇත්ත වෙලා ජීවත් වෙන්නෙ. ඒක තමා එයාට දුක එන්නෙ. එහෙම එකක් එයාට නෑ. නැති දෙයක් ඇතිකර ගැනීම තුලයි දුක හටගෙන

තියෙන්නෙ. හැබැයි නැති දෙයක් නැති බව දන්නවනම්, දුකකුත් නෑ. ඔන්න ඒකයි ඇත්ත. නැති දෙයක් ඇති කර ගැනීම තමයි දුක. ඕක අපි විවිධාකාර පැතිකඩයන් ඔස්සේ නැති දෙයක් ඇතිකර අපි පෙන්නුවා. විද්‍යාව හා සම්බන්ධ කරල 'කොන්ටම්' න්‍යායට එකතු කරල, විදුලි බලාගාරයක නොගැලපෙන අන්ත දෙකක් තියෙනව කියල මේක 'ස්පාක්' වෙනකොට ශක්ති ශූන්‍යතාවයක් නිසයි ශක්තිය කියන්නේ. ශූන්‍යතාවයනෙ, මේ වගේ භෞතික පැත්තටත් අපි ගොඩක් පෙන්නලා තියෙනවා දේශනාවල. ඇත්තටම ශූන්‍යතාවක් නැති ස්භාවය ලෝකයේ පවතින ලොකුම ශක්තිය නැති ස්වභාවය. මේක දැන් කියනකොටත් තේරෙන්නෙ නැති වෙන්න පුළුවන්. මෙහෙම කීවොත් කාටවත් තේරෙන්නෙ නෑ. හරි පරිස්සමින් ඕන මේක කියන්න. මොකද කෙනෙකුට තේරෙන ප්‍රමාණයක් තියෙනවනෙ. ඒ ප්‍රමාණයට එහා කීවොත් තේරෙන්නැති වෙනව. නමුත්, මේක තව එහාට තේරෙන කෙනෙක් හිටියොත් ප්‍රශ්න කලොත් අපිට පැහැදිලි කරන්න පුළුවන්. මේ හැම දේකම මේක තියෙනවා. මේ 'එම්ප්ටිනස්' එක (emptiness) ශූන්‍යතාවය. සිත කියල දෙයක් නෑ. සිතටත් ඒකමයි වෙලා තියෙන්නෙ. දුකෙන් මිදෙන්න බුදුන් වහන්සේ ලෝකයට හෙලි කරන්නෙ සිතේ පැත්ත පමණයි. මේක අනෙත් හැම පැත්තකම තියෙනවා. බුදුකෙනෙක් ලෝකයට පහලවෙලා මේ සත්‍ය එලියට ගන්නෙ ඒ අනිත් පැතිවල ඒව කීවට එච්චර අදාල නෑ. නමුත්, මේ සිත දුකින් මිදෙන්නත් ඒකමයි කියන්න ඕන. සිත හැදුන හැටි දකින්න ඕන. මේකෙ ඇත්ත දකින්න ඕන. සත්‍ය, කොහොමද මේ එක පාරටම කීවට පිළිගන්න බෑනෙ. දැන් කව්රුහරි කියනවා මේ සිත කියලා දෙයක් නෑ. ඇයි පිළිගන්නේ කවුරුත් පිළිගන්නෙ නැ.



www.buddothpado.com

එහෙනම් එයාට ඒකෙ ඇත්ත පෙන්වන්න වෙනව. තව තව ළිහල පෙන්වන්න වෙනව. ඇයි එහෙම කියන්නෙ කියලා. අන්න එතකොට තමයි සිත හැදෙන හැටි පෙන්නුවේ. එතකොට තමා බුදුරජානණ් වහන්සේ ඔය මහා නිධාන සූත්‍රය, සළායතන සූත්‍රය එතකොට මේ සූත්‍ර ඔක්කොම තියෙන්නේ, උපාදාන සූත්‍ර, ස්කන්ධ සූත්‍ර ඔක්කොම තියෙන්නෙ මේක පෙන්වන්න. ඔය සතර සති පට්ඨානය, ආර්යඅෂ්ඨාංගික මාර්ගය, ඔය පටිච්ච සමුප්පාදය, චතුරාර්ය සත්‍ය සේරම කියන්නෙ. එකම කථාව. ඒක ඔප්පු කරන්නයි සේරම ටික විග්‍රහ කරන්නෙ මොකක්ද 'සිත කියල දෙයක් නෑ' ඒක දෘෂ්ඨියක්, මේක හඳුනාගත්තොත්, අර සිංදුවක් තියෙනව නේද 'හදුනාගත්තොත් ඔබ මා' කියලා. බුදුරජාණන් වහන්සේ ඒක තමයි කියන්නෙ මහණෙනි අශ්වලෝමයක් සියක් කඩකට පැලෙන්න දුණුවායෙක් විදිනව මහණෙනි, එයත් විශ්වාස කල හැකියි. නමුත්, මෙය අවබෝධ කර ගැනීම නම් සූකර නොවේ. මේක අවබෝධකර ගන්න එක ලේසි නෑ. අවබෝධ කරගත්තොත් තමයි ප්‍රත්‍යක්ෂ වෙන්නෙ. සිතක් නැති බව මහණෙනි. ඉදිකටුවක් වැටුනොත් මහමුහුදේ හරි නැත්නම් වැලිගොඩක හරි, එය සොයා ගැනීම විය හැකියි මහණෙනි, නමුත්, මේ ධර්මය අයබෝධ කරගැනීම පහසු නොවේ කියලා. එයත් විය හැකයි. මෙය ඊටත් වැඩිය අපහසුයි කියල කියන්නේ. උන්වහන්සේ උපමා සැහෙන්න කියනව. අර හිමිදිරි උදෑසන පන්දර තණ අග දියබිදක යමෙක් දේදුන්නක් දකීද? ඊටම අදාල කෝණයකින් බැලුවොත් පමණයි මහණෙනි ඒ දේදුන්න පේන්නේ. මේක ඊටම අදාල කෝණයකින් දකින්න ඕන. ඒ කෝණෙටම විතරයි මේක අසුවෙන්නේ සිත කියලා දෙයක් නැතිබව, ඕන ඕන විදිහට

බැලවට මෙය පේන්නේ නෑ කිසිම කෙනෙකුට මේ සත්‍ය අවබෝධ වෙන්නෙ නෑ. පරමසත්‍ය අති දුර්ලබයි අති ගාම්භීරයි, මේක අපි සරල මනසකින්, අන්තයට හිරවුන මනසකින් කොහොමද මේක අවබෝධ කරන්නෙ. මේක අති දුර්ලභයි. අති සියුම් කාරනාවක් හැබැයි මේක දැනුමක් විතරක් වෙලා මදි. ප්‍රත්‍යක්ෂතාවය තමන් එදිනෙදා ජීවිතයේ හිත හැදුන හැටි මේතාක් මේ සිතුවිලි ගොඩනැගුනු හැටි, හිත දැකපු හැටි, මේ තාක් මේ සිතට රැවටුන හැටි, සිත හැදුන හැටි එවා ලිහි ලිහී යන හැටි දැක - දැක මිදි මිදී යන ගමන ප්‍රත්‍යක්ෂ වෙන්නෙ එහෙම දෙයක් නැති බවට. ඒ තාක් ප්‍රත්‍යක්ෂතාවයට කවුරුත් පත්වන්නේ නෑ. ඒ කියන්නේ ඒ තාක් මේ සසර දුකින් මිදීමක් වෙන්නේ නෑ. කොයිතරම් සියුම් කාරණයක්ද නේද? කොයිතරම් වටිනවද මේ ඉදිරිපත් කිරීම, ඔබටම වැටහේවි. මෙවැනි ඉදිරිපත් කිරීම් මාලාවක් අපි ඉදිරිපත් කරල තියෙනවා. මෙයයි පරම සත්‍යය. මේකට ප්‍රතිපදාවක් අවශ්‍යයි. මෙය ඔබ දරාගන්නව.පළමුව දෙවනුව. මේ දක්වා මේ සිත අධ්‍යනය කලයුතු වෙනවා හැදුන ආකාරය දැන ගත යුතු වෙනව. ඒ වෙනුවෙන් තමා අපි මේ දේශනා මේ තරම් ඉදිරිපත් කරන්නෙ. ඔබට එය දකින්න ඕන නිසා. මිදි-මිදී දකින ආකාරය ඕන නිසා. දකින ආකාරය ගැන කියන්න ඒක් එක් කෙනාගෙ සවභාව වලට, කෙන කෙනාගේ අත්දැකීම් වලට, වෙනස් වෙනව ඒ ප්‍රත්‍යක්ෂතාවයට පත්වන ආකාරට. එනිසා කමටහන වෙනස් වෙන්නෙ. ඒ අනුවයි ඔබ ප්‍රත්‍යක්ෂතාවයට පත්වන්නෙ. පත්වන ආකාරය බුදුන්වහන්සේ පෙන්වන්නේ එක උපමාවකින් ගඟෙන් එතර වෙන්න හදපු පාරු නෑ මහණෙනි. තමා විසින්ම පාරුව සාදා ගත යුතුයි මහණෙනි' කියල. ඒ කියන්නෙ, තමන්ගේ ඒ ස්වභාවය හිත

හැදුන හැටි දැකීම තමන්ගේ හුරුව, ඇත්තටම එදිනෙදා මේ හුරුපුරුදු එව තමයි ගලවන්න ඕන. එකයි සබ්බාසව සූත්‍රයේ පෙන්වන්නේ, ඒ අනුවයි අපි ඇත්තටම මේ පාරුව හදනව කියල කියන්නෙ. අපි එන එන අරමුණු දකින්න සකස්කර ගන්න ඕන. ඒකයි පාරුව. මේ සිතට අරමුණක් එනවිට ඒ අරමුණට සත්‍ය පෙන්වන ආකාරය එය සතර ඉරියව්වෙම, එදිනෙදා කටයුතු කරනකොට, ඔබගේ වෘත්තිය අනුව, ස්වභාවය අනුව, ඔබ කාන්තාවක්ද, පිරිමි කෙනෙක්ද, වයසක කෙනෙක්ද, තරුණ කෙනෙක්ද, එතකොට ඒ අනුව ඔබගේ එදිනෙදා හුරුපුරුදු, ගති පුරුදු, ඔබගේ විශ්වාස ඒ සියල්ලම මේ ගමනේදී ඔබ සකස්කරගත යුතුයි කමටහන් විදිහට ඔබ එතන - එතන 'තත්‍ර තත්‍ර විපස්සති' එතන එතන සත්‍ය දකින්න. ඔබගේ යථාභූත ඥාණය, යෝනියෝ මනසිකාරයත් එක්ක මේ යන ගමන ඔබ පාරුව සකස් කරගෙන ගඟට දාල මේ ගඟෙන් එතෙර වෙන්න යන ගමනක් හැබැයි ඔබගේ දැනුම, ඔබ දන්නව කියල හිතන අවබෝධය මේ තාක් ධර්ම දැනුම, මේ ගඟට පාරුව දැම්මට පස්සෙ මේ සිතට එන අරමුණු වලින් මිදී- මිදී යන එක්තරා අවස්ථාවකදී ඒ සියල්ල අත්තහල යුතුයි. එසේ නොවුන හොත් ඔබට ඒ සිතේ සත්‍ය ඔබ දකින්නෙ කොකෙහාමද? සිත කියල දෙයක් නැති වෙන්න නම් ඔය සිත කියල කියන්නේ ඔබේ දැණුම, ඒ දැණුමයි ඔබට වදදෙන්නේ, දන්නව කියන එක, මම ඉන්නව කියන්නේ 'දන්න දැණුම' දන්නව කියන එකයි එය නැති වුන තැනයි සිත නැති වෙන්නේ, එතකොට මේ පාරුව ඔබ දියට දැම්ම වගේ තමයි. එක තැනකදී ඔබට මේ පාරුව, ඔබ දැගලුවොත් ගිලෙනවා, නොගියොත් ගිලෙනව. අන්න කරන්න දෙයක් නැති අවස්ථාවක් තමයි. 'ඕඝ තරණ' සූත්‍රයේ



www.buddothpado.com

පෙන්වන්නෙ. එතනට එන්න නම් 'පච්චය පරිග්ගහ' ඤාණයට එන්න ඕන. එතන ඉන්ද්‍රිය ධර්ම බල ධර්ම බවට පත්වෙන තැනට එන්න ඕන. දීර්ඝ පැහැදිලි කිරීම් කරගෙන ආවා අපි දිගටම ශ්‍රද්ධා සිත සත්‍ය දකිනවා, වීර්‍ය, ඒක මුලින් පෙන්වනවා 'සතිය' ඒක දැකීම සත්‍ය දකින 'සමාධිය' අනිමිත්ත සමාධිය' ශ්‍රද්ධා, වීර්‍ය, සති, සමාධි, ප්‍රඥා, ප්‍රඥාව ඒ සිතේ සත්‍ය දකින ප්‍රඥාව. ඒක බල ධර්ම බවට පත්වන අවස්ථාව තමා 'ඕස' තරණ සූත්‍රයේ පෙන්වන්නෙ. බාහිර ඇත්ත කරගත්ත කෙනාට මේ මාර්ගයක් නැහැ. බාහිරය ඇත්ත කරගත්ත කෙනාට මෙ නිවන් මගක් නෑ. රූපය ඇත්ත කරගත් කෙනාට නිවන් මගක් නෑ. මේ සාශනයේ 'ඉධ භික්ඛවේ භික්ඛු' මේ සාසනයේ කෙනෙක් වෙන්නෙත් නෑ. මේ ඒකායනෝ අයං භික්ඛවේ භික්ඛු කියල බුදුන් වහන්සේ පෙන්වන්නෙ. මේ බාහිරයෙන් මිදුණ කෙනා සත්‍ය අවබෝධ කරගත් කෙනා, අන්ත දෙකින් මිදුන කෙනා, අජ්ජත්ත බාහිර අන්ත දෙකින් මිදුන කෙනා, නාමයෙන් රූපයෙන් මිදුන තැන පච්චය පරිග්ගහඤාණය පිවිසි තැනයි. මෙතන තියෙන්නෙ වචන වලින් කියනව නම්, පර්යාය අනුව කියනවනම්, ඔබගේ දැනුම අනුව කියනවනම් ඔය විදිහටයි කියන්න වෙන්නෙ. හැබැයි ඔය දැනුම මොකුත් නැති සුනීත, සෝපාක වගේ කිසිම දෙයක් දන්නැති කෙනෙකුට කියනවනම් මෙන්න මෙහෙමයි කියන්න වෙන්නෙ.සිතට අරමුණක් එනව, හැබැයි බාහිර ඔබ හිතන දේ නෙමෙයි තියෙන්නෙ, සම්මුති ප්‍රඥප්ති සිතින් හදාගත්තු ලෝකෙක අපි ජීවත්වෙන්නෙ බාහිර තියෙන ලෝකෙක නෙමේ. අපි හදාගත්ත සම්මුති ලෝකෙක නාමික ලෝකෙක නාමික ලෝකෙක අපි ඉන්නව. හැබැයි, ඒක සත්‍යයක් නෙමේ.

03

# අපි තෙරුවන් සරණ යමු.

අපි අද විමසා බලමු මේ සැබෑම බුද්ධ කවුද කියලා. කොහොමද අපි තෙරුවන් සරණ යන්නෙ කියලා. අපි උපතින් බෞද්ධ යැයි සම්මත ව උපත ලබා සිටිමු. එසේ ජීවත්වෙන අපි කොකෙහාමද නියමාකාරයෙන අවබෝධයෙන් යුතුව ම තෙරුවන් සරණ යනනෙ. ඔබ සිතා බලන්න මොහොතක්.

සම්මා සම්බුදුරජාණන් වහන්සේ අවබෝධ කොට වදාළ බුද්ධ භාෂිතයන් ත්‍රිපිටක පොත් වහන්සේලා තුළ ඉතාමත් නිර්මලව පවතින බව ඒවා පරිශීලනය කරන නුවණැතියන්ට පැහැදිලිවේ. 'යෝ ධම්මං පසසති, සෝ මං පස්සති' එදා බුදුරජාණන් වහන්සේ වක්ඛලී හාමුදුරුවන්ට පැවසීහ. 'වක්කලී මේ කුණු ශරීරය දෙස බැලීමෙන් නුඹට කවදාවත් බුදුන් දකින්න බැහැ. ධර්මය දකින්න. එවිට ඔබට මා දැකිය හැකි යැයි පැවසූහ.' එසේ නම් අපිට බුදුරජාණන් වහන්සේ ඒ බුද්ධ ස්වභාවය දැකිය හැකි වන්නේ ධර්මය දැකීම තුළින්මය. එදා බුදුරජාණන් වහන්සේ ගයා ශීර්ෂයෙහි බෝමැඩ අබියස පස්මරුන් පරදවා සම්මා සම්බුද්ධත්වය අවබෝධ කරගත්හ. එසේ අවබෝධ කල අතිගාම්භීර ධර්මය කෙසේ නම් කෙලෙස් වලින් වැසුණු ලෝකයා තේරුම් ගනිම්දෝ යැයි සැකයක් ඇති විය. ඒ සඳහා සුදුස්සන් සොයා වඩින බුදුරජාණන් වහන්සේට අතර මගදී 'උපක' නම් ආජීවකයෙක් හමුවිය. බුදුරජාණන් වහන්සේගේ ප්‍රභාෂ්වර

චිත්ත සන්තානය මතු පිටින්ද දුටු නිසාදෝ උපක මෙසේ ඇසූහ.

ඔබ කවුද මනුෂ්‍යයෙක්ද නෑ

එහෙනම් ඔබ දෙවියෙක්ද නෑ මම දෙවියෙකුත් නෙමේ.

එහෙනම් ඔබ ගාන්ධර්වයෙක් ද නෑ මම ගාන්ධර්වයෙකුත් නෙමේ

එහෙනම් ඔබ කවුද?

මෙහිදී අපට හොඳටම පැහැදිලියි බුදුරජාණන් වහන්සේ මේ සත්ව පුද්ගල ස්වභාවය අතහැර මේ බුද්ධ ස්වභාවයම ඉස්මතු කරමින් මම බුද්ධ කියලා කියනවා.එහෙනම් ඇයි අපි ඒ බුදුරජාණන් වහන්සේ අත්හල සත්ව පුද්ගල ආත්මීය ස්වභාවයන්ටම කොටුවෙලා හිරවෙලා වැඩ කරන්නේ. අපි සම්මුතියේ ඉන්න ඕනෑ, මල් පූජා කරමු. දන් පූජා කරමු. ඒ සියල්ල හා සම්මා සම්බුද්ධ යනු ස්වයංභූ ඥාණයෙන් අවබෝධ කොට වදාළා වූ අති පාරිශුද්ධවූ ස්වභාවයන් බව අපි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ ආර්යය පර්යේෂණ සූත්‍රය මොනවට පැහැදිලි වේ. කරුණු සලකා බැලීමෙන්ම අපිට අවබෝධයක් ඇති කර ගත හැකි වෙනව. බුදුරජාණන් වහන්සේ එහෙම නැත්නම් බුද්ධ කියන මේ උත්තරීතර ස්වභාවය කිසිම සත්ව පුද්ගල කථාවලින් බැහැර වී ගිය ඒ කථාවලින් තොරවූ නිර්මල පාරිශුද්ධ වූ ස්වභාවයක් බව එය අවබෝධයෙන් කෙනෙකු විසින් උත්සාහයෙන් දැකිය යුතු දැනගත යුතු බුද්ධ ස්වභාවයක්. එය අවබෝධ ඥාණයක්. වර්තමාන ලෝක සත්වයා සම්මුතිය තුළ හිරවී බුදුරජාණන් වහන්සේ විසින් බැහැර කළ ප්‍රත්‍යක්ෂ ඥාණයෙන් යුතුව



www.buddothpado.com

අවබෝධ කොට වදාළ ආත්මීය ස්වභාවය කොට ගෙන මයි ජීවත් වන්නේ. එපමණක් නොව සියලු කටයුතු උතුම් පූජා භූමිය තුලද එවැනි අවබෝධයක් තුල තමන් ආරෝපණය කරගත් රාමුවක් තුල සිරවී ධර්මය දේශනා කිරීම කණගාටුවට කරුණකි. එසේ නම් අපි විසින් ඒවා මිත්‍යාදෘෂ්ටි හැටියට සලකා ධර්මය දැක දැන ඒවා බැහැර කොට අවබෝධයෙන් යුතුව ඒ බුද්ධ ස්වභාවය අවබෝධ කොට ගත යුතුම ය. ඒ කියන්නේ බාහිර ලෝකයෙන් මිදී ඒ අවිධිමත් ස්වභාවය අත්දැකීමයි. ඒ ස්වභාවය අනිමිත්තයි. අප්පතිට්ඨිතයි. සුන්‍යතයි. එයමයි සිතෙන් මිදුණු ස්වභාවය. එය චේතෝ විමුක්තිය ස්වභාවය. එහෙනම් අපි කොහොමද මේ බුද්ධ ස්වභාවයට පත්වන්නේ. මෙතෙක් ලොව පහළ වූ සියලු බුදුරජාණන් වහන්සේලා අවබෝධ කොට ගත් ඒ ධර්මතාවයන් කාලයේ වැලිතලාවට සැඟව ගියද බුදුරජාණන් වහන්සේ තමන් විසින් උත්තසාහයෙන් කෙලෙස් වඩන වෙර ඇතිව වීර්යයෙන් යුතුව ස්වයංභූ ඥාණයෙන් අවබෝධ කොට ගෙන උතුම් සම්මා සමබුද්ධත්වයට පත් වෙති. කෙනෙක් ඒ පිරිසිදු ධර්මය කල්‍යාණ මිත්‍රයෙක්ගෙන් අසා දැනගෙන ශ්‍රැතමය ඥාණයෙන් යුතුව යෝනිසෝමනසිකාරයෙන් සහ යථාභූතඥාණයෙන් දැක දැන ඒ කියන්නේ අසා දැනගත් ධර්මය නුවණින් යුතුව ම විමසා බලා සත්‍යඥාණය ඇතිකර ගත යුතු වෙනව. එනම්, ඒ බුද්ධ ස්වභාවය ප්‍රත්‍යක්ෂකොට යථාභූතඥාණයෙන් ලොවට හෙළිකළ ඒ බුද්ධ ස්වභාවය උතුම් ත්‍රිපිටක ග්‍රන්ථයේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව තුළ සූත්‍ර ධර්මයන්ගෙන් ඉතා හොඳින් සුරැකිව මේ දක්වා පැවතීම අපේ භාග්‍යක් මේ දහම පිරිසිදු කර ගැනීමට එම දේශනා උපකාර කරගත හැකි



www.buddothpado.com

වෙනව. උපක අහන්නේ ඔබ වහන්සේ මනුෂ්‍යයෙක්ද කියලා. බුදුරජාණන් වහන්සේ කියනවා නෑ කියලා. එහෙනම්, මෙතන පුද්ගල ස්වභාවයක් නෑ නේද?. කොතනද වැරදුනේ අපට, සැබෑම ධම්ම කියන්නේ මොන ස්වභාවයකටද? ධර්මය දකින්නා බුදුන් දකී.'සෝ ධම්මං පස්සති සෝ මං පස්සති එහෙතනම් මේ ධර්මය කුමක්ද? මේ ධර්මය පොතක තියෙන දෙයක්ද? එහෙනම් මේ ධර්මය දැනුමක්ද? නෑ නේද, එහෙනම් මේ ධර්මය කියන්නේ පටිච්චසමුප්පාදයේ ධම්මං නේද? ඒ ධර්මය මෙනෙහි කරන ආකාරය එහෙම නම්, ධර්මය කියනනේ පටිච්ච සමුප්පාදයෙහි ධම්මං නම් පටිච්ච සමුප්පාදය කියන්නේ කුමක්ද? එහෙනම් 'ඉමස්මිං සති ඉදං හෝති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති' ඉමස්මිං අසති ඉදන්නහොති ආදී වශයෙන් මේ පටිච්ච සමුප්පාදය මෙනෙහි කරන ආකාරය. මෙය ඇති කල්හි මෙය වේ. මෙය නැති කල්හි මෙය නොවේ, මෙය ඉපදුනු කල්හි මෙය උපදී නිරුද්ධ වූ කල්හි මෙය නිරුද්ධ වේ. එහෙනම් ඒ පටිච්චසමුප්පාදය කියන්නේ හේතු ඵල දහමයි. එහෙනම් මේ හේතු ඵල දහම තුල මෙය ඇති කල්හි මෙය වේ යැයි කියනව නම් එතැන ස්ථිර වශයෙන්ම දෙයක් නෑ නේද? හේතුන් පටිච්ච සම්භූතං හේතු භංගා නිරුජ්ජති, සම්භූතා කියනතොට හේතු නැති වෙනකොට නැති වෙනව කියන එක සිතුවිල්ලක් හේතුවෙන් නේද මැවෙන්නෙ. සිතුවිල්ලක් හේතුවෙන් නැතිවන විට නැතිවන්නේ බාහිර තියෙන දෙයක් එහෙම නැති වෙන්නේ නෑ නේද එහෙනම් මේ සියල්ල ගැනයි කතා කරන්නේ 'මනෝ පුබ්බංගමා ධම්මා චිත්තේන නීයති ලෝකෙ' මේ බුදුන් වහන්සේ දේශනා කරන ධර්මය සම්පූර්ණයෙන් ම අපිට මේ ආයතන ලෝකයයි ඒ තමයි චිත්තේන නීයති ලෝක ඒකතමයි

මනෝ පුබ්බංගමා ධම්මා ඒ සේරම එහෙනම් සිත තුල මැවෙන ලෝකයක් නේද? එහෙනම් මේ පටිච්ච සමුප්පාදය තුළ කතා කරන මෙය ඇති කල්හි මෙය පවතී. කියන හේතුඵල දහම තුළ සම්භූත වෙනවා කියන්නේ, සිත තුල නේද ලෝකය මැවෙන්නේ එහෙනම් මේ කතා කරන ධර්මතාවය ධම්ම කියන එක ඇත්තටම බාහිර දෙයක් නැති බව නේද එහෙනම් ඒ ධම්ම කියන්නේ ඇත්තටම දෙයක් නැති බව නේද මේක මනා කොට ඔබට පටිච්චසමුප්පාදය බවත් පේනවා නමුත්, එ විග්‍රහය තුළ දෙයක් නැති වෙන බවයි. මේක සමීකරණයක් වගේ තමයි ඔය ඉමස්මිං සති ඉදං හෝති ඉමස්ස උත්පදා ඒ විග්‍රහය ඇත්තටම ඒ හේතු ඵල දහමක්. එතනමයි ඊට පස්සේ ඒ විදිහට මොකක්ද මේ සංඝ කියන්ර් මොකක්ද මේ සිතට එන අරමුණෝ සත්‍ය දකින එකම නේද මේ අරමුණ නේද අපි මේ ධම්ම කියලා කතා කරන්නේ අරමුණම නේද මේ අරමුණම නේද සිත කියලා කියන්නේ අරමුණමයි නේද සිත එහෙතනම් ඒ අරමුණෝ ඒ සිද්ධාන්ත වලින් හිත අරමුණම කියලා පෙන්වනවා නේද, අරමුණෝ සත්‍ය දකින එක නේද එහෙනම් ඒ සංඝ කියන්නේ, සිතට එන අරමුණෝ සත්‍ය දකින කෙනා එහෙනම් සංඝ, අපිට සංඝ සූත්‍රය තියෙනවා, භික්ෂු සූත්‍රය තියෙනවා මේ හැම සූත්‍රයක ම මොකක්ද පෙන්වන්නේ සිතට එන අරමුණෝ සත්‍යය දික කෙනා නම් සංඝයා වහන්සේ කියන්නේ ඒ දකින කෙනාටර් එයාගේ උපාදානස්කන්ධයේ උදය වැය දකින සිලය රකින්ර් ඒක නේ එහෙනම් ඒ අරමුණොහි ඇති වීම නැතිවීම නේද දකින්නේ එහෙනම් ඒ අරමුණු නේද මේ සත්‍ය දකින්ර් එහෙතනම් සත්‍ය දකින කෙනා නේද අන්න එතනයි සංඝ තියෙන්නේ එහෙනම් අපි බුද්ධ දකින්න ඕන හරියට ධම්ම

දකින්න ඕන, අපි සංඝ දකින්න ඕන, එහෙනම් අපි තෙරුවන් කියන්නේ මොනවද රුවන් වලට එහෙනම් ඒ රත්න මොකක් ද මේ මාණික්‍ය රත්නය මේක තතමයි වටිනාම දේ. ඒ බුදුරාජණන් වහන්සේ දුකින් මිදෙන මඟක් ලෝකයට හෙළි කරන්නේ එහෙනම් ඒ දුකින් මිදෙන මග කියන්නේ එහෙනම් එතැන 'නත්ථි මේ සංණං අඤද්ඤදං' සත්වයා අසරණයි සත්වයා දුකට වැටිලා ඒ දුකට පත්වෙන සත්ත්වයාට දුකින් මිදෙන්න මගක් හෙළිකරනවා එහෙනම් ඒ සත්ත්වයාට ඒ දුකින් මිදෙන මග හැර වෙන සරණක් නෑ අපි අසරණ වෙලා ඉන්නේ සිතුවිලි හින්දා එහෙනම් මේ සිතුවිලි හින්දා අපි අසරණයි, මේ සිතේ සත්‍ය දකින තැනයි අන්න අපිට මේ හමුවන්නේ ඒ කියන්නේ සිතේ සත්‍ය දකින තැනයි එතකොට තමයි සංඝං සරණං ගච්චාමි කියන්නේ, ඒ අරමුණෝ සත්‍ය දකින තැනයි එහෙනම් එතැනම නේද තියෙන්නේ ධර්මය. දකින තැන' ඒ අරමුණෝ නේද ධර්මය දකින්නේ එතනම නේද අපි දුකින් මිදෙන්නෙ නත්ථි මේ සරණං අඤද්ඤදං ධම්මෝ මේ සරණං වරං ධර්මය දැක්කොත් නේද අපි අසරණකමින් මිදෙන්නෙ එහෙමනම් අපි සිතුවිලි ඇත්ත කර ගත් සැනින් අපි අසරණයි හැබැයි සිතුවිලි වල සත්‍යක් නැතැයි දකින තැන අපි අසරණ කමින් මිදෙනවා අන්න ඒ සත්‍යය දැකීමයි ධම්මං, අපිට වෙන සරණක් නැහැ ඒ සිතේ සත්‍ය දැකීමයි නත්ථි මේ සරණං අඤද්ඤදං සංඝෝ මේ සරණං වරං කියන්නේ සිතට එන අරමුණෝ සත්‍ය දකිනවා කියන්නේ බාහිරයක් හමුවන්නේ නැහැ කියන්නේ අරමුණෝන් මිදීමයි චේතෝ විමුක්තියයි නිමිති හමුවුනේ නැහැ. මෙලෙස අපි අවබෝධයෙන් යුතුවම තෙරුවන් සරණ යමු.

**තෙරුවන් සරණයි**



www.buddothpado.com

කාලයේ වැලිතලාවට සැඟව ගිය
ඒ පරම සත්‍ය හෙළි කරන්නට
සුදුසු මොහොත පැමිණෙමින් තිබේ.

ප්‍රඥා හිරු කිරණ දසක හමනව
දුකින් මිදෙන සිත් සැනසුම් සුසුමින් සැනසෙනවා
සත්‍යයේ මහා සිංහනාදය ඔබට ඇසෙනවද?
ඔබ සංසාර චක්‍රයක අතරමංවෙලා
විටෙක ඔබ සතුටින් - විටෙක ඔබ දුකින්
මේ දෝලනය වන ජීවිතය කුමක්ද?
ඔබ සත්‍ය දන්නේ නෑ
සත්‍ය හෙළිකරන්නට අප සූදානම්
මේ ඔබේ කථාවයි:
ඔබ සසර දුකින් මිදෙන කථාවයි.

සිතින් මිදෙන මග
        දුකින් මිදෙන මග
නිවන් දකින මග

එයයි නිස්සරණය..........

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ ප්‍රකාශන